Sinhalese | සිංහල

# ළමා ආරක්ෂණ ප්‍රමිති පිළිබඳ කෙටි මග පෙන්වීමක්

සංස්කරණය 1.10 • 2023 අප්‍රේල්

COMMISSION FOR CHILDREN AND YOUNG PEOPLE

දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසම

# අන්තර්ගතය

පසුබිම .......... 3

මෙම මාර්ගෝපදේශය භාවිතා කරන්නේ කෙසේද .......... 4

1 වැනි ප්‍රමිතිය: සංවිධාන විසින් ආදිවාසී දරුවන් හා යොවුන් පුද්ගලයන්ගේ විවිධ හා සුවිශේෂී වූ අනන්‍යතා හා අත්දැකීම්වලට සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් ස්ථාපනය කරයි .......... 6

2 වැනි ප්‍රමිතිය: ළමා ආරක්ෂාව හා යහපැවැත්ම සංවිධානයේ නායකත්වයේ, පාලනයේ හා සංස්කෘතියේ ඇතුළත් වී තිබේ. .......... 13

3 වැනි ප්‍රමිතිය: දරුවන් හා යොවුන් පුද්ගලයන් ඔවුන්ගේ හිමිකම් සම්බන්ධයෙන් සවිබල ගැන්වෙන අතර ඔවුන්ට බලපාන තීරණ ගැනීමේ දී ඔවුන් සහභාගී කරවා ගැනීම හා ඔවුන්ව බැරෑරුම් ලෙස සැලකේ. .......... 17

4 වැනි ප්‍රමිතිය: ළමා ආරක්ෂාව හා යහපැවැත්ම ප්‍රවර්ධනයෙහි ලා පවුල් හා ප්‍රජාවන් දැනුවත්ව හා සම්බන්ධ වී සිටියි. .......... 21

5 වැනි ප්‍රමිතිය: සමානාත්මතාව තහවුරු කර ඇති අතර ප්‍රතිපත්ති සහ භාවිතය තුළ විවිධ අවශ්‍යතාවලට ගරු කරනු ලැබේ .......... 24

6 වැනි ප්‍රමිතිය: දරුවන් හා යොවුන් පුද්ගලයන් සමග වැඩ කරන පුද්ගලයින් ප්‍රායෝගිකව ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ අගයන් පිළිබිඹු කිරීමට සුදුසු වන් අතර ඒ සඳහා සහාය දක්වයි. .......... 28

7 වැනි ප්‍රමිතිය: පැමිණිලි සඳහා ක්‍රියාවලිය හා ගැටලු ළමා කේන්ද්‍රීය වේ. .......... 33

8 වැනි ප්‍රමිතිය: දරුවන් හා යොවුන් පුද්ගලයන් ආරක්ෂිතව තබා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයෝ අඛණ්ඩව අධ්‍යාපනය සහ පුහුණුව තුළින් දැනුම, කුසලතා සහ දැනුවත්භාවයෙන් සන්නද්ධව සිටිති. .......... 38

9 වැනි ප්‍රමිතිය: දරුවන්ට හා යොවුන් පුද්ගලයන්ට හානි සිදු වීමට ඇති අවස්ථා අවම කරමින්, භෞතික සහ මාර්ගගත පරිසරයන් මගින් ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරයි. .......... 42

10 වැනි ප්‍රමිතිය: ළමා ආරක්ෂක ප්‍රමිති ස්ථාපනය කිරීම නිතිපතා සමාලෝචනය කර වැඩිදියුණු කෙරේ. .......... 46

11 වැනි ප්‍රමිතිය: දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් සංවිධානය ආරක්ෂිත වන්නේ කෙසේද යන්න පිළිබඳව ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ලේඛනගත කරයි. .......... 49

# පසුබිම

සෑම දරුවෙකුට ම ආරක්ෂිත බවක් දැනීමට සහ ආරක්ෂිතව සිටීමට අයිතියක් ඇත, නමුත් ආරක්ෂාව ඉබේම සිදු නොවේ.

මෑත වසරවලදී වික්ටෝරියානු පාර්ලිමේන්තුවේ *විශ්වාසය පාවාදීමේ* විමර්ශනය[1] සහ ළමා ලිංගික අපයෝජනයට ආයතනික ප්‍රතිචාර පිළිබඳ රාජකීය කොමිසම[2] (රාජකීය කොමිසම) ඇතුළුව බොහෝ නොනැසී සිටින්නන්ගෙන් සහ බහුවිධ විමසීම්වලින් ඉගෙනීමේ ප්‍රතිලාභ අපට ලැබී ඇත. අපයෝජන වැළැක්වීම සඳහා සංවිධානවලට නිවැරදි සංස්කෘතියක්, පද්ධති, ක්‍රියාවලීන් සහ අවබෝධයක් නොමැති විට, දරුවන්ට සිදුවන හානියේ විනාශකාරී ප්‍රමාණය මෙයින් පෙන්නුම් කර ඇත.

කායික, ලිංගික, චිත්තවේගීය සහ මානසික හිංසනයන් සහ නොසලකා හැරීම්වලින් දරුවන් ආරක්ෂා කිරීමට ළමා ආරක්ෂණ සංවිධානයක් විසින් සුපරික්ෂාකාරී පියවර ගනියි. එවන් සංවිධාන දරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්මට මුල් තැන දෙන අතර එහි සෑම අංශයක ම ළමා ආරක්ෂාව සඳහා කැපවීමක් ඇතුළත් කරයි.

වික්ටෝරියාවේ අනිවාර්ය ළමා ආරක්ෂණ ප්‍රමිති (ප්‍රමිති) 2016 සිට ක්‍රියාත්මක වේ.

රාජකීය කොමිසමෙන් පසුව, වික්ටෝරියානු රජය විසින් ප්‍රමිතීන් සමාලෝචනය කර ඇත.[3] සමාලෝචනය මගින් ප්‍රමිති සඳහා ප්‍රබල සහයෝගයක් සොයා ගෙන ඇති අතර, ළමා ආරක්ෂක සංවිධාන සඳහා වන ජාතික මූලධර්ම සමග වඩාත් හොඳින් සමපාත වීමට හා ප්‍රමිතිවල පරිපාලනය ශක්තිමත් කිරීමට වෙනස්කම් ගණනාවක් ද නිර්දේශ කර තිබේ.

මෙම නිර්දේශයන්ට අනුකූලව, 2021 දී වික්ටෝරියානු රජය විසින් යාවත්කාලීන කරන ලද ප්‍රමිති නිකුත් කිරීම සිදු විය. එයට 2022 ජූලි 1 සිට අදාළ වන යාවත්කාලීන කළ ප්‍රමිති 11ක් ඇතුළත් වේ.

ප්‍රමිති ක්‍රියාවට නැංවීමේ දී, ආයතනවලට මේ දක්වා ඔවුන් දරන උත්සාහයන් ගැන මෙනෙහි කිරීමටත්, ළමයින්ව හානිවලින් හා අපයෝජනයන්ගෙන් නිදහස් කර ගැනීමට ඔවුන්ගේ හැකියාව දිගටම ගොඩනගා ගැනීමටත් අවස්ථාව තිබේ.

---

[1] පවුල් සහ ප්‍රජා සංවර්ධන කමිටුව, වික්ටෝරියානු පාර්ලිමේන්තුව, විශ්වාසය පාවාදීම: ආගමික සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධානවල ළමා අපචාර සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ විමර්ශනය වික්ටෝරියා 2013, 2: පි 262.

[2] ඕස්ට්‍රේලියානු පොදුරාජ්‍ය මණ්ඩලය, ළමා ලිංගික අපයෝජනයට ආයතනික ප්‍රතිචාර පිළිබඳ රාජකීය කොමිසම, 2017.

[3] සෞඛ්‍ය හා මානව සේවා දෙපාර්තමේන්තුව, වික්ටෝරියානු ළමා ආරක්ෂණ ප්‍රමිති සමාලෝචනය, 2019.

# මෙම මාර්ගෝපදේශය භාවිතා කරන්නේ කෙසේද

මෙම මාර්ගෝපදේශය මගින් එක් එක් ප්‍රමිති කෙටියෙන් ගෙනහැර දක්වන අතර, අපේක්ෂිත ප්‍රතිඵල, අවම අවශ්‍යතා සහ එක් එක් ප්‍රමිතිවලට අනුකූල වීමට ආයතනවලට සහාය වන අනුකූලතා දර්ශක හඳුනා ගනී. ආයතනවලට ප්‍රමිතිවලට අනුකූල විය හැකි ආකාරය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක මගපෙන්වීමක් ළමා සුරක්ෂිත සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වන [ළමා හා යොවුන් පුද්ගලයන් පිළිබඳ කොමිසමේ මාර්ගෝපදේශයේ ඇතුළත් වේ](). 

සෑම ප්‍රමිතියක් ම ආයතන විසින් අත්කර ගත යුතු අපේක්ෂිත **ප්‍රතිඵලයක** ප්‍රකාශයක් ලෙස පළ කිරීම සිදු වේ. උදාහරණයක් ලෙස, ප්‍රමිති 3 යටතේ ළමයින් සහ යොවුන් පුද්ගලයන් ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව සවිබල ගැන්වීම, ඔවුන්ට බලපාන තීරණවලට සහභාගී වීම සහ ඒවා බැරෑරුම් ලෙස සැලකීම අවශ්‍ය වේ.

සෑම ප්‍රමිතියකට ම ආයතන විසින් සපුරාලිය යුතු **අවම අවශ්‍යතා** ඇතුළත් වේ. තව දුරටත් නම්‍යශීලී වෙමින්, අපේක්ෂිත ප්‍රතිඵලය සපුරාලීමට ආයතනවලට සහාය වීමට වැඩි මග පෙන්වීමක් නව ප්‍රමිති මගින් සපයයි.

සෑම ප්‍රමිතියක් සඳහා ම, ඔබේ සංවිධානය මෙම අවම අවශ්‍යතා සපුරාලන බව පෙන්වන ලේඛන සහ ක්‍රියාමාර්ග ලැයිස්තුවක් දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසම (කොමිසම) විසින් සපයා ඇත. අපි මේවා **අනුකූලතා දර්ශක** ලෙස හඳුන්වමු. අනුකූලතාව ඇගයීමේ දී නියාමකයින් සොයන්නේ කුමක් ද යන්න පිළිබඳව ආයතන වැඩි උපදෙස් ලබා ගන්නා බවට ලැබෙන ප්‍රතිපෝෂණවලට ප්‍රතිචාර සේ අනුකූලතා දර්ශක සකස් කර තිබේ. අනුකූලතා දර්ශක සාමාන්‍යයෙන් අවම අවශ්‍යතා එකකට හෝ වැඩි ගණනකට අනුරූප වන අතර ඒවා දර්ශකයට පසුව වරහන් තුළ දක්වා ඇත.

**අනුකූලතා දර්ශකයේ** එක් එක් පරිච්ඡේදයේ ලැයිස්තුගත ලේඛන ඉදිරිපත් කරන්නේ නම් හා දක්වා ඇති කටයුතු සම්පූර්ණ කරන්නේ නම් සාමාන්‍යයෙන් සංවිධානයක් ප්‍රමිතිවලට අනුකූල වනු ඇත. කෙසේ වෙතත් ගෙන ඇති ප්‍රවේශය මගින් එක් එක් ප්‍රමිතිය මගින් දක්වා ඇති **ප්‍රතිඵල** හා **අවම අවශ්‍යතා** සපුරන බව ඔබේ සංවිධානය විසින් තහවුරු කර ගත යුතුය.

ප්‍රමිති, පුළුල් හා විවිධ පරාසයක වූ සංවිධානවලට අදාළ වන බැවින් මෙම මාර්ගෝපදේශය සාමාන්‍ය ස්වභාවයක් ගනු ලබයි. ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත් ඔබේ ප්‍රවේශය, ප්‍රමිතිවල **ප්‍රතිඵල** සහ **අවම අවශ්‍යතාවලට** අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැක.

කොමිසම ඇතුළුව වික්ටෝරියාවේ ප්‍රමිති සඳහා සම-නියාමකයන් හය දෙනෙකු සිටින අතර, ඔබට කොමිසමේ වෙබ් අඩවියෙන් ඔබේ නියාමකයා සොයා ගත හැකිය. ළමුන්

සඳහා බහුවිධ ආකාරයේ සේවා සපයන සමහර ආයතනවලට නියාමකයන් එකකට වඩා තිබිය හැක. සමහර නියාමකයින් විසින් ඔවුන් නියාමනය කරන අංශ සහ සංවිධාන සඳහා නිශ්චිත මාර්ගෝපදේශ නිකුත් කර ඇත. ඔබේ ක්ෂේත්‍රයට සම-නියාමකයෙකුගේ මඟ පෙන්වීම අදාළ වන විට හා මෙම මාර්ගෝපදේශයට වෙනස් වන විට ඔබේ සංවිධානය විසින් ක්ෂේත්‍රයේ සිදුවන කටයුතුවල දී ඔබේ සම නියාමකයාගේ මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

ප්‍රමිති ක්‍රියාත්මක කරන්නේ කෙසේද සහ දරුවන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩි විස්තර සඳහා, ළමා ආරක්ෂක සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වන මාර්ගෝපදේශය කියවන්න.

**පාරිභාෂිතය:** මෙම මාර්ගෝපදේශයෙහි ආදිවාසී යන යෙදුම ආදිවාසී සහ ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී පුද්ගලයන් ඇතුළකරණය කර ගනියි. අවුරුදු 18ට අඩු දරුවන් හා යොවුන් පුද්ගලයන් යන දෙපිරිසම ඇතුළත් කර ගැනීමට අපි දරුවා හෝ දරුවන් යන යෙදුම භාවිතා කරන්නෙමු. මෙම මාර්ගෝපදේශයට අනුව, දරුවන් සමග කටයුතු කරන හෝ ස්වේච්ඡාවෙන් සේවය කරන ඕනෑම ව්‍යාපාරයක් හෝ කණ්ඩායමක් සංවිධානයක් සේ සැලකේ.

# 1 වැනි ප්‍රමිතිය: සංවිධාන විසින් ආදිවාසී දරුවන් හා යොවුන් පුද්ගලයන්ගේ විවිධ හා සුවිශේෂී වූ අනන්‍යතා හා අත්දැකීම්වලට සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් ස්ථාපනය කරයි

**1 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධානයක් විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ තහවුරු කර ගත යුතුය:**

1.1 දරුවකුට සිය සංස්කෘතිය ප්‍රකාශ කිරීමට හා සිය සංස්කෘතික අයිතීන් භුක්තිවිඳීමට ඇති හැකියාව දිරිගැන්වෙන අතර එයට සක්‍රීය සහයෝගයක් ලබා දෙයි.

1.2 ආදිවාසී සංස්කෘතියේ ශක්තීන් සහ ආදිවාසී දරුවන් හා යොවුන් පුද්ගලයන්ගේ යහපැවැත්ම හා ආරක්ෂාව වෙනුවෙන් එහි ඇති වැදගත්කම පිළිගනිමින් අගය කිරීමට සිය සාමාජිකයන් සවිබල ගැන්වීම පිණිස සංවිධානය තුළ උපායමාර්ග ඇතුළත් වී ඇත.

1.3 ආයතනය තුළ පවත්නා ජාතිවාදය හඳුනාගැනීම, එයට එරෙහි වීම හා එය නොඉවසීම තහවුරු කර ගැනීම සඳහා සංවිධානය විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. ජාතිවාදය ක්‍රියාත්මක වන ඕනෑම අවස්ථාවක් සම්බන්ධයෙන්, අදාළ ප්‍රතිඵල සහිතව ආමන්ත්‍රණය කෙරෙනු ඇත.

1.4 සංවිධානය විසින් එය තුළ, ආදිවාසී දරුවන්ගේ, යොවුන් පුද්ගලයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සහභාගීත්වය හා ඇතුළත්කරණයට සක්‍රීයව සහයෝගය ලබා දෙමින් එයට පහසුකම් සපයයි.

1.5 ආයතනයේ සියලු ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග, පද්ධති හා ක්‍රියාවලියන් එක්ව ගත් කළ සංස්කෘතිමය වශයෙන් ආරක්ෂිත හා අන්තර්ගත පරිසරයක් නිර්මාණය කරන අතර ආදිවාසී දරුවන්, යොවුන් පුද්ගලයන් හා ඔවුන්ගේ පවුල්වල අවශ්‍යතා සපුරයි.

## ප්‍රධාන කරුණු

- ඔබේ සංවිධානය සමග කටයුතු කරන විට, සියලු දරුවන්ට ආරක්ෂාවක් දැනෙන බව හා ඔවුන් ආරක්ෂිත බව ඔබ විසින් තහවුරු කළ යුතුය. මෙයට ආදිවාසී [4]දරුවන් ද ඇතුළත් වේ.
- ආදිවාසී දරුවන් සඳහා සංස්කෘතික ආරක්ෂාව අර්ථ දක්වා ඇත්තේ, 'සිය ආත්මීය විශ්වාසයන් හා සංස්කෘතිය ප්‍රකාශ කරමින් දරුවන්ට තමා ම වීමට පහසුව සලසන, ආරක්ෂිත, පෝෂණීය වූ හා යහපත් පරිසරයක් ලබා දීම හා ඔවුන්

[4] මෙම මාර්ගෝපදේශයේ භාවිතා කර ඇති 'ආදිවාසී' යන යෙදුමට ආදිවාසීන් හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී පුද්ගලයන් ඇතුළත් වේ.

රැකබලා ගැනීම ඔවුන්ගේ ආදිවාසීබව ගැන ගෞරවයක් සහිත අය විසින් කිරීමෙන් ඔවුන්ගේ ස්වයංත්වය හා අනන්‍යතාව පිළිබඳ හැඟීම දිරිගැන්වෙන බවය'[5]

- කිසියම් සංවිධානයක් ගැන ආදිවාසී පුද්ගලයන් විශේෂයෙන් ම ආදිවාසී දරුවන් විසින් දකින්නේ හා අත්විඳින්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීම, සංස්කෘතික ආරක්ෂාව අත්පත් කර ගැනීමට ඇතුළත් වේ.
- සෑම ආදිවාසී පුද්ගලයෙකුට ම විශිෂ්ට ඉතිහාසයක් හා අත්දැකීම් තිබේ. මුල් ජාතිකයන් ලෙස ආදිවාසී පුද්ගලයන්ගේ සුවිශේෂී තත්වය හඳුනාගැනීම වැදගත්ය.
- ආදිවාසී ලෙස හඳුනාගැනීම දරුවාගේ අනන්‍යතාවේ කොටසකි. අන් සෑම පුද්ගලයෙකුට මෙන් ම, ආදිවාසීන්ට ද විවිධ වූ ජීවිත අත්දැකීම් හා ලක්ෂණ තිබේ. සෑම දරුවෙකු ම ඔවුන්ට ම අනන්‍ය ලක්ෂණ, ශක්තීන් හා අභියෝග සහිතව හා සුවිශේෂී ලෙස හඳුනාගනිමින් සංවිධාන විසින් ආදිවාසී දරුවන්ට සහයෝගී පරිසරයක් සැපයිය යුතුය.
- සංස්කෘතිය හා අනන්‍යතාව එකිනෙක බැඳී ඇති අතර, ආදිවාසී දරුවන්ට ඔවුන්ගේ අනන්‍යතාව පිළිබඳව හොඳ දැනීමක් ඇතිකර ගැනීමට උපකාර කිරීම මගින් ඔබ ඔවුන්ගේ සංස්කෘතික හිමිකම් භුක්තිවිඳීමට ද ඔවුන්ට උපකාර කරනු ඇත.
- සිය සංස්කෘතිය හා අනන්‍යතාව ප්‍රකාශ කිරීමට හැකි වීම මගින් ආදිවාසී දරුවන් වඩාත් ශක්තිමත් හා ආරක්ෂිත වේ.[6] බොහෝ හේතු නිසා මෙය වැදගය. ළමා අපයෝජන වැලැක්වීමේ සන්දර්භය තුළ, මෙය වැදගත් වන්නේ ආදිවාසී දරුවන්ට තමා බවට පත් වීමට හා ඔවුන්ගේ සංස්කෘතිය ප්‍රකාශ කිරීමට ආරක්ෂාවක් නොදැනෙන විට, අනෙක් අය විසින් ඔවුන් අපයෝජනවලට ලක්කිරීමේ අවදානම වැඩි වීම හා ඔවුන් ඒවා වාර්තා කිරීමට කැමැත්ත අඩු වීම සිදුවන නිසාය.[7]
- සංස්කෘතික හිමිකම් යනු තනිව හෝ කණ්ඩායමක කොටසක් ලෙස එක් එක් දරුවාගේ හිමිකම් වන අතර, ඒවා සිය පසුබිම, චාරිත්‍ර, සමාජ චර්යාව, භාෂාව, ආගම හෝ අධ්‍යාත්මිකත්වය, විශ්වාස හා ජීවන රටාව වර්ධනය කර ගැනීම හා ප්‍රකාශ කිරීම සඳහා උපයෝගී වේ.
- ආදිවාසී පුද්ගලයන්ට සිය අනන්‍යතාව හා සංස්කෘතිය භුක්ති විඳීමට; සිය භාෂා භාවිතය පවත්වාගෙන යාමට; ඔවුන්ගේ ඥාති සම්බන්ධතා පවත්වාගෙන යාමට;

---

5 SNAICC, Cultural safety, 2021.

6 වික්ටෝරියා ප්‍රාන්තයේ පවුල්, සාධාරණත්වය හා නිවස දෙපාර්තමේන්තුව, Wungurilwil Gapgapduir Aboriginal Children and Families Agreement, 2018, p 35.

7 P Anderson et al., *Aboriginal and Torres Strait Islander children and child sexual abuse in institutional settings*, Report for the Royal Commission into Institutional Responses to Child Sexual Abuse, [pdf 1MB], 2017, pp 30–33.

හා සාම්ප්‍රදායික නීති හා චාරිත්‍ර යටතේ ඔවුන්ට සම්බන්ධයක් ඇති භූමිය, ජලය හා වෙනත් සම්පත් සමග සම්බන්ධතා පවත්වාගෙන යාමට සුවිශේෂී සංස්කෘතිකමය හිමිකමක් තිබේ.[8]

- ඔබේ සංවිධානය ඇතුළත්කරණය සහිතව තබා ගැනීම ඔබේ වගකීම වන අතර මේ සඳහා අධ්‍යාපනය, ප්‍රත්‍යාවේක්ෂණය හා ධනාත්මක ක්‍රියාවන් අවශ්‍ය වේ.
- ආදිවාසී සංස්කෘති ගැන ඉගෙනීම අඛණ්ඩ ගමනක කොටසි. සංවිධානයේ ප්‍රජා නායකයින්, කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා සේවකයන්, දරුවන් හා අනෙක් සාමාජිකයන් අතර දැනුවත්බව හා අවබෝධය ගොඩනැගීම වැදගත්ය. සංවිධානයේ ඔවුන්ගේ කාර්යභාරය හා වගකීම් අනුව ඔවුන්ට අවශ්‍ය විය හැකි විවිධ ආකාරයේ උපකාර ගැන සිතා බලන්න.
- සංවිධානයක් තුළ දරුවකුගේ පවුලේ අය සාදරයෙන් පිළි ගැනීම හා ඇතුළත්කරණය මගින් ඔවුන්ගේ ආරක්ෂාව සඳහා දායකත්වයක් ලබා දෙයි.[9] ආදිවාසී සංස්කෘතියේ, අධ්‍යාත්මිකතාවේ හා අනන්‍යතාවයේ අත්‍යාවශ්‍ය පදනම වන්නේ පවුලයි. අනෙක් සංස්කෘතිවලට වඩා ආදිවාසී සංස්කෘතිවල දී පවුල වඩාත් පුළුල් ලෙස නිර්වචනය කෙරේ.[10]
- ජාතිවාදය දරුවන්ට හානිකර වන අතර එය ඔවුන්ගේ යහපැවැත්මට හා ආරක්ෂාව බලපෑම් කරයි. එය ළමා අපයෝජනයේ එක් ආකාරයක් විය හැකිය. ඔබේ සංවිධානය සමග කටයුතු කරන විට දරුවන්ට හා ඔවුන්ගේ පවුල්වලට ජාතිවාදය අත්විඳීමට සිදු වුවහොත්, ඔවුන්ට ඇති ගැටලු මතු කිරීමට හෝ පැමිණිලි සිදු කිරීමට තරම් විශ්වාසයක් නොදැනෙනු ඇත. ජාතිවාදය පිළිබඳ පැමිණිලි බැරෑරුම් ලෙස සැලකීම හා ඒවාට පරිපූර්ණ වශයෙන් ප්‍රතිචාර දැක්වීම මගින් ඔබේ සංවිධානය විසින් ජාතිවාදය නොඉවසන බව පෙන්නුම් කරනු ඇත.
- ආදිවාසී සංස්කෘතියට සහයෝගය දැක්වීමේ හෝ පිළිගැනීමේ පුළුල් ප්‍රකාශ වැදගත් වන නමුත් මේවායින් පමණක් දරුවන් වෙනුවෙන් වන ආරක්ෂාව ඇති වීම සිදු නොවේ. සංස්කෘතික ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා නිර්මාණය කිරීම සඳහා ඔබේ සංවිධානයේ ප්‍රවේශය, සංවිධානය පුරාම කාවැදී තිබිය යුතුය. මෙයින් අදහස් වන්නේ සංවිධානයේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, පද්ධති හා ක්‍රියාවලියන් මගින් ආදිවාසී දරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අවශ්‍යතා සලකා බලමින් සපුරන බවයි.

---

8 මානව හිමිකම් හා වගකීම් ප්‍රඥප්ති පනත 2006 (Vic) අනුසාරයෙන් සකස් කර ඇත.

9 වික්ටෝරියා ප්‍රාන්තය, සෞඛ්‍ය හා මානව සේවා දෙපාර්තමේන්තුව, Balit Murrup: Aboriginal social emotional wellbeing framework 2017–2027, 2017.

10 SNAICC, පවුලට ඇති සම්බන්ධතාව.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

මෙම ප්‍රමිති මගින් ආදිවාසී දරුවන්ගේ සංස්කෘතිකමය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන සංවිධානවලට නව වගකීම් පැවරීම සිදු කරයි.

සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත වූ පරිසරයක් ස්ථාපනය කිරීම සඳහා කාලය, කැපවීම හා අර්ථවත් නියැලීමක් අවශ්‍ය වේ. සංවිධාන විසින් දීර්ඝ කාලීන වශයෙන් කැපවිය යුතු අතර, සෑම වසරක ම 1 වැනි ප්‍රමිතිය සමග ඔවුන්ගේ අනුකූලතාවයේ ප්‍රගමනය පවත්වා ගැනීමට අර්ථවත් කටයුතු සිදු කළ යුතුය.

මෙම නව ප්‍රමිතිය සමග අනුකූලතාව ලබා ගැනීමේ දී එක් එක් සංවිධාන විවිධ මට්ටම්වල සිටින බව කොමිසම අවබෝධ කරගෙන සිටියි. ආදිවාසී දරුවන් සඳහා සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් ස්ථාපනය කිරීමෙහි ලා තව දුරටත් සැලකිය යුතු උත්සහයක් දරන සංවිධානවලට උපකාර කිරීම සඳහා **පදනම් පියවර (Foundation steps)** සපයනු ලැබේ. මෙම **පදනම් පියවර** මගින් ප්‍රමිතිය සමග අනුකූල වීමට හා ක්‍රියාකාරී සැලැස්මක් ගොඩනගා ගැනීමට සංවිධාන විසින් කළ යුතු කටයුතු හඳුනා ගැනීමට ඔවුන්ට උදව් ලබා දෙයි.

ආදිවාසී දරුවන් වෙනුවෙන් සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ඔබේ සංවිධානය දැනටමත් මනා ප්‍රගමනයක් ලබා ඇති බව දැනෙන්නේ නම්, **පදනම් පියවර** පිළිබඳව අවධාරණය අවශ්‍ය නොවනු ඇත. ඔබේ සංවිධානය විසින් දැනටමත් කර ඇති වැඩකටයුතු මතින් ගොඩනැගීම ඔස්සේ සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත සංවිධානයක් කරා යන ගමන අඛණ්ඩව සිදුකර ගැනීමට හැකිවන පරිදි, ඔබේ සංවිධානය වෙත **වැඩිදුර පියවර** ලබා දෙනු ඇත.

කොමිසම විසින් පළමුව **පදනම් පියවර** සමග වන අනුකූලතාව සම්බන්ධයෙන් සොයා බලනු ඇත. **පදනම් පියවර** මගින් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පොදු කැපවීම් සඳහා අවශ්‍ය වෙනස්කම් ගෙනහැර දක්වන නමුත් මෙම වෙනස්කම් සිදු කිරීම සඳහා සංවිධානවලට කිසියම් කාලයක් ගත වන බව හඳුනා ගනියි. ක්‍රියාකාරී සැලැස්ම මගින් ප්‍රමිතියට පූර්ණ අනුකූලතාවයක් ලබා ගැනීම සඳහා වන සංවිධානයේ මාවත දැක්විය යුතුය. මෙම ප්‍රමිතියට පූර්ණ අනුකූලතාව කෙබඳු විය හැකිද යන්න තේරුම් ගැනීමට **වැඩිදුර පියවර** මගින් ආයතනවලට උපකාර කරයි.[11]

---

[11] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

## පදනම් පියවර

### ලේඛන

- ආදිවාසී දරුවන්ගේ සංස්කෘතික ආරක්ෂාව සඳහා පොදු කැපවීමක් පවතින අතර එය මහජන ප්‍රවේශය සඳහා එය ප්‍රදර්ශනය කෙරේ (1.1, 1.4, 1.5 සහ 5.4 සමඟ සම්බන්ධය)
- ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රතිපත්තිය ඇතුළු ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, ආදිවාසී දරුවන්ට ගරු කිරීම සහ ඔවුන් අගය කිරීම පිළිබඳව සංවිධානයේ කැපවීම විස්තර කරයි. මෙයට පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ:
  - දරුවන්ට ඔවුන්ගේ සංස්කෘතිය ප්‍රකාශ කිරීම සහ සංස්කෘතික අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා සේවකයන් විසින් ඔවුන් දිරිමත් කර සහයෝගය ලබා දිය යුතුය.
  - ආදිවාසී දරුවන් හා ඔවුන්ගේ පවුල්වල අය සංවිධානය තුළ සහභාගීවීම හා අන්තර්කරණය සම්බන්ධව කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා සේවකයන් සක්‍රීය සහයෝගය දැක්වීම හා අවශ්‍ය පහසුකම් සැලසීම කළ යුතුය.
  - සංවිධානය තුළ ජාතිවාදය නොඉවසින අතර, විභව ප්‍රතිවිපාක ඇතුළුව සංවිධානය විසින් එයට ප්‍රතිචාර දක්වන ආකාරය
  - සංවිධානයේ සමග සම්බන්ධව සිටින සියලු දෙනාට, [12]ආදිවාසී සංස්කෘතියේ ශක්තීන් පිළිගැනීමට හා අගය කිරීමට සහ එමගින් ආදිවාසී දරුවන්ගේ යහපැවැත්ම හා ආරක්ෂාවට ඇති වැදගත්කම අවබෝධ කර ගැනීමට උපකාර කිරීම සංවිධානයේ නායකත්වයේ වගකීමයි. (1.1, 1.2, 1.3, 1.4, 1.5)
- ආචාරධර්ම සංග්‍රහය හා තනතුරු විස්තර මගින් කාර්යමණ්ඩලයේ හා ස්වේච්ඡා වෘත්තිකයන්ගේ චර්යාවන් පිළිබඳ අපේක්ෂාවන් දැක්වෙන අතර පහත දැක්වෙන දේ එයට ඇතුළත් වේ:
  - ජාතිවාදය කිසිසේත් ම නොඉවසීම හා ජාතිවාදය පිළිබඳ සිදුවීම් සම්බන්ධයෙන් කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් කටයුතු කරන බවට අපේක්ෂා කිරීම
  - සිය සංස්කෘතිය ප්‍රකාශ කිරීමට හා සංස්කෘතික හිමිකම් භුක්ති විඳීමට දරුවන්ට අවශ්‍ය සහයෝගය ලබා දීම. (1.1, 1.3)
- ආදිවාසී දරුවන්ගේ විවිධ හා අද්විතීය අනන්‍යතා හා අත්දැකීම්වලට ගරු කෙරෙන හා ඒවා අගය කෙරෙන සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් ස්ථාපනය කිරීම සඳහා 2023 ජූලි 1 වැනි දින වන විට සංවිධානය ගන්නා පියවර ක්‍රියාකාර සැලසුමක් මගින් ගෙනහැර දක්වයි.

[12] ළමා ආරක්ෂක සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වන මාර්ගෝපදේශය තුළින් සංවිධානයේ ප්‍රජාව කවුරුන්ද යන්න පිළිබඳ අර්ථදැක්වීම බලන්න.

## පදනම් පියවර

### ක්‍රියාමාර්ග

- ජාතිවාදය පිළිබඳ සිදුවීම් නිරන්තරයෙන් හඳුනාගනිමින් ආමන්ත්‍රණය කිරීම
- සංවිධානය විසින් දැනටමත් ගෙන ඇති පියවර හඳුනාගැනීම:
  - ආදිවාසී සංස්කෘතිය අවබෝධ කර ගැනීමට, ගරු කිරීමට සහ අගය කිරීමට මෙන් ම ආදිවාසී දරුවන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සඳහා මෙහි ඇති වැදගත්කම අවබෝධ කර ගැනීමට කාර්ය මණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට හා නායකයින්ට සහාය වීම, මඟ පෙන්වීම හෝ පුහුණුව ලබා දීම
  - ආදිවාසී දරුවන් හා ඔවුන්ගේ පවුල්වල අයගේ සහභාගීත්වය හා අන්තර්කරණයට සක්‍රීයව සහයෝගය දැක්වීම හා පහසුකම් සැලසීම
  - ආදිවාසී පුද්ගලයන්, ඔවුන්ගේ ජයග්‍රහණ, ප්‍රජාවන් හා සංස්කෘතිය පිළිගැනීම හා සැමරීම (1.2)
  - සංවිධානය තුළ පවතින ජාතිවාදය හඳුනාගෙන එය නිසි ලෙස ආමන්ත්‍රණය කරන බව සහතික කර ගැනීම (1.3)
  - සංවිධානය තුළ ආදිවාසී දරුවන්ට සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම (1.5 හා 5.4 සමඟ සම්බන්ධය)
- දැනට ගෙන ඇති පියවර හා ඇති හිඩැස් හඳුනාගනිමින්, 1 වැනි ප්‍රමිතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානය විසින් ගත යුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීම ක්‍රියාකාරකම් සැලසුමක් ඔස්සේ ක්‍රියා කිරීමට වගකිව යුතු පුද්ගලයා හෝ කණ්ඩායම, ලබාගත හැකි සම්පත් හා කාලරාමුව හඳුනා ගැනීම (1.1, 1.2, 1.3, 1.4, 1.5)

## වැඩිදුර පියවර

### ලේඛන

- ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රතිපත්තිය ඇතුළු ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මගින්, සංවිධානයේ අපේක්ෂාවන් විස්තර කරන අතර ආදිවාසී දරුවන්ගේ විවිධ සහ සුවිශේෂී අනන්‍යතා සහ අත්දැකීම්වලට ගරු කෙරෙන හා අගය කෙරෙන සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා කාර්ය මණ්ඩලය, ස්වේච්ඡා වෘත්තියන් සහ නායකයින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තරාත්මක මග පෙන්වීමක් සපයයි. (1.5)

### ක්‍රියාමාර්ග

- ආදිවාසී පුද්ගලයන්, ප්‍රජාවන්, සංස්කෘතින් හා අගයන් පිළිගනිමින් හා ඒවාට ගරු කරමින්, සංවිධානය විසින් අන්තර්කරණය සහිත මෙන් ම සාදරයෙන් පිළිගන්නා සුළු භෞතික හා මාර්ගගත පරිසරයක් නිර්මාණය කරයි. (1.2)

- සංවිධානය මගින් සියලු දරුවන්ට සංස්කෘතික හිමිකම් පිළිබඳ තොරතුරු ලබාදෙන අතර ආදිවාසී දරුවන්ට සිය සංස්කෘතිය ප්‍රකාශ කිරීම දිරිගැන්වීම සඳහා සංවිධානය විසින් සක්‍රීය පියවර ගනියි. දරුවන් සිය සංස්කෘතිය ප්‍රකාශ කරන විට, සංවිධානයේ කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් විසින් ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබා දේ. (1.1, 1.4 හා 3.1 සමග සම්බන්ධය)
- සංවිධානය තුළ දී දරුවන් සවිබල ගැන්වීමට සංවිධානය විසින් පියවර ගන්නා අතර, ආදිවාසී දරුවන්ට සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත ආකාරයට සහභාගී වීමට ඔවුන්ට අවස්ථා ලබා දෙයි (1.4 හා 3.6 සමග සම්බන්ධය)
- සංවිධානය විසින් ආදිවාසී පවුල්වලට සංවිධානය තුළ සහභාගී වීමට සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත අවස්ථා ලබා දෙයි.
- සංවිධානය විසින් එහි ප්‍රජා සාමාජිකයන්ට පහත දැක්වෙන දේ ලබා දෙයි.
  - සංස්කෘතික හිමිකම්, ආදිවාසී සංස්කෘතිවල ශක්තීන්, හා ආදිවාසී දරුවන්ගේ යහපැවැත්ම හා ආරක්ෂාව සඳහා සංස්කෘතියේ ඇති වැදගත්කම ගැන තොරතුරු
  - සංස්කෘතික ආරක්ෂාව හා ආදිවාසී දරුවන් ළමා අපයෝජන හා හානිවලින් වැලැක්වීම අතර ඇති සම්බන්ධතාව පිළිබඳ තොරතුරු
  - ආදිවාසී සංස්කෘති හා ඉතිහාසයන් පිළිබඳව ඉගෙනීමට හා අගය කිරීමට අවස්ථා. (1.1, 1.2)
- ආදිවාසී සංස්කෘතීන්ගේ ශක්තීන් පිළිගැනීමට සහ අගය කිරීමට සංවිධානයේ ප්‍රජාව දිරිමත් කරන උපාය මාර්ග සැකසීම, ක්‍රියාත්මක කිරීම හා සංවිධානයට ඇතුළත් කර ගැනීම. (1.2)
- ජාතිවාදය වැලැක්වීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම හා ජාතිවාදය පිළිබඳ සිදුවීම් නොඉවසීම. (1.3)

# 2 වැනි ප්‍රමිතිය: ළමා ආරක්ෂාව හා යහපැවැත්ම සංවිධානයේ නායකත්වයේ, පාලනයේ හා සංස්කෘතියේ ඇතුළත් වී තිබීම.

**2 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධාය අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කර ගත යුතුය:**

2.1 සංවිධානය විසින් ළමා ආරක්ෂාව සඳහා පොදු කැපවීමක් සිදු කිරීම.

2.2 සංවිධානයේ ඉහළ සිට පහළ දක්වා සියලු මිට්ටම්වල ළමා ආරක්ෂණ සංස්කෘතිය වෙනුවෙන් ඉදිරිපත් වී නිරූපනය කිරීම

2.3 පාලන විධිවිධාන මගින් සෑම මට්ටමක දී ම ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම.

2.4 අචාර ධර්ම සංග්‍රහය මගින් කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් සඳහා අපේක්ෂිත හැසිරීම් ප්‍රමිතීන් සහ වගකීම් පිළිබඳ මාර්ගෝපදේශ සපයයි.

2.5 අවදානම් කළමනාකරණ උපාය මාර්ග මගින් දරුවන්ට හා යොවුන් පුද්ගලයන්ට ඇති අවදානම් වැළැක්වීම, හඳුනා ගැනීම සහ අවම කිරීම අවධාරණය කරයි.

2.6 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයෝ තොරතුරු හුවමාරු කර ගැනීම සහ වාර්තා තබා ගැනීම පිළිබඳ සිය වගකීම් අවබෝධ කරගෙන සිටිති

## ප්‍රධාන කරුණු

- ඔබේ සංවිධානය විසින් ළමා ආරක්ෂාව සඳහා පොදු කැපවීමක් සිදු කළ යුතුය. ඔබේ සංවිධානය විසින් දරුවන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙන බවත් ළමා අපචාර හෝ හානි නොඉවසන බවත් මෙමගින් සමස්ත ප්‍රජාවට ම නිවේදනය කරයි.
- ළමා සුරක්ෂිත සංස්කෘතියක් යන්නෙන් අදහස් වන්නේ සංවිධානයක් තුළ හවුලේ භුක්ති විඳිය හැකි දරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙන ආකල්ප, අගයන්, ප්‍රතිපත්ති හා භාවිතයන් ඇති බවයි.
- ළමා සුරක්ෂිත සංස්කෘතියක් ඇති කර ගැනීම සඳහා ඔබේ සංවිධානයට එහි නායකයින්ගේ, කාර්ය මණ්ඩලයේ, ස්වේච්ඡා වෘත්තිකයන්ගේ, සාමාජිකයින්ගේ සහ දරුවන්ගේ එදිනෙදා චින්තනය සහ ක්‍රියාවන් තුළ ළමා ආරක්ෂාව ගොඩනැගීම අවශ්‍ය වේ.
- සංවිධානයේ අගයන් මූර්තිමත් කිරීමට ඔබේ සංවිධානයේ ප්‍රජාව නායකයින් දෙස බලයි. මෙයින් අදහස් වන්නේ ළමා ආරක්ෂක සංස්කෘතියක් සඳහා නායකයින්ගේ චාර්යාව ඉතා වැදගත් වන බවයි. නායකයින් විසින් ළමා ආරක්ෂක භාවිතයන් වෙනුවෙන් ඉදිරිපත් වී නායකත්වය ආදර්ශයක් සේ සැපයිය යුතු අතර

කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් වෙතින් අපේක්ෂිත චර්යාවන් ආදර්ශයට ගනිමින් දරුවන් සම්බන්ධ හානිකර චර්යාවන් නොඉවසිය යුතුය.

- ඔබේ සංවිධානය විසින් දරුවන්ගේ ආරක්ෂාවට හා යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙන ආකාරය හා එය සිදු කිරීම කුමන පියවර ගන්නේ ද යන්න ළමා ආරක්ෂක හා යහපැවතුම් ප්‍රතිපත්තියක් මගින් සැකෙවින් දක්වයි. කාර්යමණ්ඩලය, ස්වේච්ඡා වෘත්තිකයන් හා සංවිධානයේ ප්‍රජාව සඳහා වන ළමා ආරක්ෂක භාවිතයන් සම්බන්ධව සංවිධානයේ අපේක්ෂාවන් එමගින් සඳහන් කරයි. ළමා ආරක්ෂාව හා යහපැවතුම් ප්‍රතිපත්තිය නිර්මාණය කිරීම ඔස්සේ මේ ගැන වැඩිදුර කියවන්න
- පාලනය යන්නෙන් අදහස් වන්නේ ආයතනයක නායකත්වය, අධීක්ෂණය හා වගවීමේ ක්‍රියාවලියයි. තීරණ ගැනීමේ අධිකාරිය ඇත්තේ කාටද, තීරණ ගත යුත්තේ හා නිරීක්ෂණය කළ යුත්තේ කෙසේද සහ පුද්ගලයන්ගේ වගවීම පවත්වා ගන්නේ කෙසේද යන්න පිළිබඳව සංවිධානයේ නීති පාලනයට ඇතුළත් වේ.[13]
- සංවිධාන අතර, පාලන විධිවිධාන වෙනස් වන අතර, ඒවා මගින් ළමා ආරක්ෂක සංස්කෘතියක් සංවර්ධනය කිරීම සඳහා වන ඔබේ සංවිධානයේ ළමා ආරක්ෂක හා යහපැවතුම් ප්‍රතිපත්ති ඉහළ සිට පහළට මෙන් ම පහළ සිට ඉහළට ක්‍රියාත්මක කරවීමට සහාය විය යුතුය. මෙයින් අදහස් වන්නේ සංවිධානයේ ප්‍රජාවේ ආදානයෙන් දැනුවත් වී නායකයින් විසින් සංවිධානයේ ළමා ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ පැහැදිලි මෙහෙයවීමක් දැක්විය යුතු බවයි. සංවිධානයේ පාලන විධිවිධාන මගින් විනිවිදභාවයට පහසුකම් සැලසිය යුතු අතර නියමිත මෙහෙයවීම සාක්ෂාත් කර ගැනීම සඳහා නායකයින්ට වගකිව පැවරිය යුතුය.
- ආචාරධර්ම සංග්‍රහය මගින් දරුවන් සමග වන පිළිගත හැකි හා පිළිගත නොහැකි චර්යාවන් ලැයිස්තුගත කළ යුතුය. එමගින් වෘත්තීමය සීමාවන්, සදාචාරාත්මක චර්යාව, අපේක්ෂිත චර්යා ප්‍රමිති හා පිළිගත හැකි හා පිළිගත නොහැකි සම්බන්ධතා පැහැදිලි කර දක්වයි. ආචාරධර්ම සංග්‍රහයක් සකස් කිරීම ගැන වැඩිදුර කියවන්න.
- ළමා අපචාර හා හානි පිළිබඳ අවදානම හඳුනා ගැනීම, වැළැක්වීම හා අඩු කිරීම පිළිබඳව සංවිධානයේ අවදානම් තක්සේරුව සහ කළමනාකරණය නිසි ලෙස අවධානය යොමු කර තිබේද යන්න අධීක්ෂණය කිරීමට සංවිධානයේ පාලන විධිවිධාන විසින් ජ්‍යෙෂ්ඨ නායකයින්ට සහාය විය යුතුය. 9 වැනි ප්‍රමිතිය තුළ ඇති ළමා ආරක්ෂක සංවිධානයක් නිර්මාණය කිරීම සඳහා වන මාර්ගෝපදේශය මගින් අවදානම හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු සපයයි.
- අදාළ තොරතුරු හුවමාරු කර ගැනීම ළමා ආරක්ෂාව කළමනාකරණය කිරීම සඳහා තීරණාත්මක වේ. ඔබේ සංවිධානයේ සංස්කෘතිය, පද්ධති හා ක්‍රියාවලි

---

[13] ඔස්ට්‍රේලියානු පාලන ආයතනයෙන් (Governance Institute of Australia) පාලනය යනු කුමක්ද? අනුවර්තනය කර ඇත.

යන මගින් සියලු මට්ටම්වල දී දරුවන්ට ඇති අවදානම් පිළිබඳව කාර්යක්ෂම තොරතුරු හුවමාරුවට ආධාර කළ යුතුය. සිය වගකීම් සම්බන්ධයෙන් කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය.

- හොඳ වාර්තා තබා ගැනීමේ පද්ධතියක් පැවතීම විනිවිදභාවයට හා වගවීමට, මෙන්ම ඔබේ සංවිධානයේ සමස්ත අවංකත්වයට ඉතා වැදගත් වේ. ළමා අපයෝජනක් හෝ හානි පිළිබඳ පැමිණිලිවලට කාර්යක්ෂම ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා නිවැරදි වාර්තා සකස් කිරීම, පවත්වා ගැනීම හා ගබඩා කර තැබීම වැදගත්ය.
- තොරතුරු හුවමාරු කර ගැනීමේ දී හා ආරක්ෂිතව වාර්තා තබා ගැනීමේ දී, එයට අදාළ වන පුද්ගලයන්ගේ විශ්වසනීයත්වය හා පෞද්ගලිකත්වය ගැන සෑම විට ම සලකා බැලිය යුතුය.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[14]

#### ලේඛන

- ළමා ආරක්ෂාව සඳහා පොදු කැපවීමක් මහජන ප්‍රවේශය සඳහා ලබා ගත හැකි අතර එය ප්‍රදර්ශනය කෙරේ.
- ළමා ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය මගින් එක් එක් ප්‍රමිතිය සම්බන්ධයෙන් සංවිධානයේ අපේක්ෂා හා භාවිතයන් විදහා දක්වයි.
- ආචාරධර්ම සංග්‍රහය මගින් දරුවන් සමග කටයුතු කිරීමේ දී කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන්ගේ චර්යාව පිළිබඳව සහ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වන අපේක්ෂාවන් දක්වා ඇත. (2.4)

---

[14] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

## ක්‍රියාමාර්ග

- සංවිධානයේ කාර්යමණ්ඩලය, ස්වේච්ඡා වෘත්තිකයන්, සාමාජිකයන් හා දරුවන් ළමා ආරක්ෂිත සංස්කෘතියක් වෙනුවෙන් ඉදිරිපත් වී නිරූපනය කරයි. ඔවුන් දරුවන් සුරක්ෂිතව තබා ගැනීම සඳහා සහයෝගය ප්‍රකාශ කරමින්, දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලු ඇති විට ක්‍රියාමාර්ග ගන්නා අතර එදිනෙදා භාවිතයේ කොටසක් ලෙස දරුවන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙයි.(2.2)
- නායකයින් විසින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් පැහැදිලි අපේක්ෂා ඉදිරිපත් කරන අතර, කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් විසින් ළමා ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන බව සහතික කරයි. (2.3)
- නායකයින් විසින් වාර්තා කිරීම පිළිබඳ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. (2.2, 2.3)
- පාලන විධිවිධානවලින් අදහස් වන්නේ ජ්‍යෙෂ්ඨ නායකයින් නිරන්තරයෙන් සංවිධානයේ ළමා ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ කාර්යසාධනය සමාලෝචනය කරන බවයි. (2.3 සහ 10.1 සමග සබැඳේ)
- පාලන විධිවිධාන යන්නෙන් අදහස් වන්නේ සංවිධානයේ අවදානම් තක්සේරුව සහ කළමනාකරණය ළමා අපචාර හා හානි පිළිබඳ අවදානම් හඳුනා ගැනීම, වැළැක්වීම සහ අඩු කිරීම කෙරෙහි නිසි අවධානයක් යොමු කර තිබේද යන්න ජ්‍යෙෂ්ඨ නායකයින් විසින් අධීක්ෂණය කරනු ලබන බවයි. (2.5 සහ 9.1, 9.3 සමග සම්බන්ධය)
- කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයෝ තොරතුරු හුවමාරු කර ගැනීම සහ වාර්තා තබා ගැනීම පිළිබඳ ඔවුන්ගේ වගකීම් අවබෝධ කරගෙන සිටිති. (2.6)
- ආචාරධර්ම සංග්‍රහය සියලු කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට සන්නිවේදනය කර ඇති අතර නායකයින් විසින් ඔවුන් එයට අනුකූල වන බවට වගවීම රඳවා ගනියි. (2.4)

# 3 වැනි ප්‍රමිතිය: දරුවන් හා යොවුන් පුද්ගලයන් ඔවුන්ගේ හිමිකම් සම්බන්ධයෙන් සවිබල ගැන්වෙන අතර ඔවුන්ට බලපාන තීරණ ගැනීමේ දී ඔවුන් සහභාගී කරවා ගැනීම හා ඔවුන්ව බැරෑරුම් ලෙස සැලකේ.

**3 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධානයක් විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කළ යුතුය:**

3.1 දරුවන්ට හා යොවුන් පුද්ගලයන්ට ආරක්ෂාව, තොරතුරු හා සහභාගීත්වය ඇතුළු ඔවුන්ගේ සියලු හිමිකම් සම්බන්ධයෙන් දැනුම් දීම සිදු කරයි.

3.2 මිත්‍රත්වයේ වැදගත්කම හඳුනා ගන්නා අතර දරුවන්ට සහ යොවුන් පුද්ගලයන්ට ආරක්ෂිත හැඟීමක් හා හුදෙකලාවීම අඩු කර ගැනීමට සම කණ්ඩායම් උපකාර කරති.

3.3 වටපිටාවට හෝ සන්දර්භයට අදාළ වන විට, දරුවන්ට සහ යොවුන් පුද්ගලයන්ට ලිංගික අපයෝජන වැළැක්වීමේ වැඩසටහන් සහ වයසට උචිත ආකාරයට අදාළ තොරතුරු වෙත ප්‍රවේශය පිරිනමනු ලැබේ.

3.4 කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයෝ හානි සිදුවීමේ සලකුණු වලට අනුගත වී සිටින අතර දරුවන්ට සහ යොවුන් පුද්ගලයන්ට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට, තීරණ ගැනීමට සහභාගී වීමට මෙන් ම ඔවුන්ට ඇති ගැටලු මතු කිරීම සඳහා ළමා හිතකාමී ක්‍රම ඔස්සේ පහසුකම් සපයයති.

3.5 දරුවන්ගේ සහ යොවුන් පුද්ගලයන්ගේ සහභාගීත්වයට පහසුකම් සපයන, ඔවුන්ගේ ආදනයට ප්‍රතිචාර දක්වන සංස්කෘතියක් වර්ධනය කිරීමට සංවිධානවලට උපාය මාර්ග තිබේ.

3.6 සංවිධාන මගින් දරුවන්ට හා යොවුන් පුද්ගලයන්ට සහභාගී වීමට අවස්ථාව සලසා දෙන අතර ඔවුන්ගේ දායකත්වයට ප්‍රතිචාර දැක්වීම මගින් විශ්වාසය සහ නියැලීම ශක්තිමත් කරයි.

## ප්‍රධාන කරුණු

- දරුවන් බලගන්වන සහ ඔවුන්ට සවන් දෙන සංවිධානයක් තුළ දී සිය ගැටලු හෝ පැමිණිලි ඉදිරිපත් කිරීමට දරුවන් පෙලඹීමට වැඩි ඉඩක් ඇත.
- දරුවන්ගේ දැක්මට අනුව සකස් වූ ප්‍රතිපත්ති හා භාවිතයන් මගින් දරුවන්ට වන හානි වඩාත් හොඳින් වළක්වා ගත හැකිය.
- තමා කෙරෙහි හා සංවිධානයක් කෙරෙහි දරුවන්ගේ ඇති විශ්වාසය ශක්තිමත් කිරීම, සවිබල ගැන්වීම යනුවෙන් අදහස් වේ. දැනුවත් තීරණ ගැනීමට සහ සිය

ජීවිත ගැන පාලනය වැඩි කිරීමට හැකියාව ලබා දීම සඳහා කුසලතා සහ දැනුම දරුවන් වෙත ලබා දීම එයට ඇතුළත් වේ.[15]

- වැඩිහිටියන් හා  සමානව  දරුවන්ට ද හිමිකම් ඇත. හිමිකම් යනු පුද්ගලයන්ගේ ඇති වෙනස්කම් නොසලකමින් ඔවුන්ට ඇති මූලික අයිතිවාසිකම්ය.
- දරුවන් සිය හිමිකම් සම්බන්ධයෙන් සවිබල ගැන්වීම යන්නෙන් අදහස් වන්නේ සංවිධානයේ නායකයින්, කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් ඇතුළු එහි සියලු පුද්ගලයන් පහත දැක්වෙන දේ කළ යුතු බවය:
  - සෑම අවස්ථාවක ම දරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම හා ඒවාට ගරු කිරීම
  - ඔවුන්ගේ හිමිකම් සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීමෙහි ලා සක්‍රීය කාර්යභාරයක් ඉටු කිරීම
  - සිය හිමිකම් භුක්ති විඳීමට ඔවුන්ට උපකාර කිරීම.
- තමා කෙරෙහි බලපාන තීරණවල සම්බන්ධව සහභාගී වීමට දරුවන්ට අයිතියක් ඇත. සහභාගීත්වය යනු දරුවන්ට තමාගේ අදහස් පැවසීමට හා දැනුම්වත් තීරණ ගැනීමට අවස්ථා සලසා දීමයි. මේ සඳහා සංවිධානවලට දරුවන් ඇහුම්කන් දීමට, සවන් දීමට හා දරුවන් පවසන දෙ අනුව උචිත වෙනස්කම් සිදු කිරීම අවශ්‍ය වේ.
- දරුවෝ ශක්තිමත් මිත්‍ර සම්බන්ධයන්ගෙන් ප්‍රතිලාභ ලබති. දරුවෝ තම මිතුරන් ඔවුන්ගේ ප්‍රධාන ආධාරකරුවන්, තොරතුරු හා උපදෙස් සපයන්නන් සේ සලකන අතර උපකාර සඳහා ඔවුන් වෙත යති. දරුවන්ට එකට මුණගැසීමට සහ විනෝද වීමට අවස්ථා ලබා දිය යුතු අතර ඔබේ සංවිධානය ඔවුන්ගේ සමාජ සම්බන්ධතා සහ මිතුරුකම්වලට උපකාරකරමින්, හිරිහැර කිරීම හෝ හුදකලා කිරීමේ හැසිරීමට අභියෝග කළ යුතුය.
- ලිංගික අපයෝජන වැළැක්වීමේ වැඩසටහන් දරුවන් වෙනුවෙන් ලබා දෙන ඔවුන්ගේ වයසට ගැළපෙන වැඩසටහන් සහ අධ්‍යාපනයයි. මෙම වැඩසටහන් මගින් වැඩිහිටියන්ගේ හෝ වෙනත් දරුවන්ගේ නුසුදුසු හැසිරීම් අවබෝධ කර ගැනීමට, විභව අපයෝජන අවස්ථාවන්ගෙන් ආරක්ෂා වීමට සහ අපයෝජන හෝ අපයෝජනයට උත්සාහ කිරීමේදී උපකාර ලබා ගන්නේ කෙසේදැයි දැන ගැනීමට ඔවුන්ගේ දැනුම සහ කුසලතා ගොඩනැගීම සිදු කරයි. දරුවන්ට ලිංගික අපයෝජන ගැන තේරුම් ගැනීමට සහ උපකාර ලබා ගන්න ආකාරය ගැන උපකාර කිරීමට මෙම වැඩසටහන් හෝ වෙනත් තොරතුරු සැපයීම ඔබේ සංවිධානයට සුදුසු දැයි ඔබ විසින් සලකා බැලිය යුතුය.
- ඔබේ සංවිධානයේ සෑම මට්ටමක ම සිටින පුද්ගලයින්ට ළමා ආරක්ෂාව, සවිබලගැන්වීම සහ ළමා අයිතිවාසිකම්වලට ගරු කිරීම සඳහා වන භූමිකාවක් ඇත. කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් ළමා අපයෝජන සහ හානි

---

[15] දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසම [සවිබල ගැන්විම හා සහභාගීත්වය: දරුවන් හා යොවුන් පුද්ගලයන් සමග කටයුතු කරන සංවිධාන සඳහා වන මාර්ගෝපදේශයක්](), 2021

පිළිබඳ සංඥාවලට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය ගැන මෙන් ම දරුවන්ගේ සහභාගීත්වය සවිබල ගැන්වීම සහ දිරිමත් කරන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත්ව සිටිය යුතුය. මේ සඳහා කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට උපකාර හෝ පුහුණුව අවශ්‍ය විය හැකිය.

- දරුවන්ගෙන් ඔවුන්ගේ අත්දැකීම් හෝ ඔවුන්ට අවශ්‍ය දේ ගැන නිතරම ඇසීම පිළිබඳව ඔවුන්ට පුරුද්දක් නැත. ඔබේ සංවිධානය විසින් ඔවුන්ට කතා කිරීමට පහසුවක් සැලසීමට සහ එසේ කිරීමට අවස්ථාව ලබා දීමට ඔවුන්ට සහාය විය යුතුය. සහභාගීත්ව ක්‍රියාකාරකම් වයසට ගැළපෙන, ඇතුළත්කරණය සහිත සහ ප්‍රවේශ විය හැකි මෙන් ම පුද්ගල අවශ්‍යතා සහ හැකියාවන් අනුව සකස් වී තිබිය යුතුය. මෙය සිදු කළ හැක්කේ කෙසේද යන්න ගැන වැඩිදුර විස්තර සවිබල ගැන්වීම හා සහභාගීත්වය: දරුවන් හා යොවුන් පුද්ගලයන් සමග කටයුතු කරන සංවිධාන සඳහා වන මාර්ගෝපදේශය වෙතින් ලබාගත හැකිය.

## අනුකූලතා දර්ශක

**මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?**

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[16]

### ලේඛන

- වයසට ගැළපෙන සහ පහසුවෙන් තේරුම් ගත හැකි මුද්‍රිත හෝ මාර්ගගත ලේඛන වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි අතර ඒවා දරුවන්ට පහත ආකාරයෙන් උපකාරී වේ:
  - ඔවුන්ගේ ආරක්ෂාව, තොරතුරු සහ සහභාගීත්වය ඇතුළුව සිය අයිතිවාසිකම් ගැන තේරුම් ගැනීමට
  - සංවිධානය තුළ සිටින වැඩිහිටියන් හැසිරිය යුත්තේ කෙසේදැයි දැන ගැනීමට
  - සංවිධානයේ පැමිණිලි ක්‍රියාවලිය මෙන් ම තමන්, තම මිතුරන් හෝ සම වයසේ මිතුරන් සම්බන්ධයෙන් ආරක්ෂාව සම්බන්ධ ගැටලු මතු කරන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීමට
  - දරුවන් ඉලක්ක කරගෙන පවතින උපකාර සේවා ගැන දැනගැනීමට (3.1)

---

[16] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

- සංවිධානයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි:
  - දරුවන්ගේ සවිබලගැන්වීම හා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම
  - දරුවන්ගේ හිමිකම් සඳහා වන උපකාර රෝපණය කිරීම (3.1, 3.4, 3.5, 3.6)

## ක්‍රියාමාර්ග

- සංවිධානයේ කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයෝ දරුවන් සමග කටයුතු කරමින් පහත දැක්වෙන දේ සඳහා ඔවුන්ට සහාය වෙති.
  - ඔවුන්ගේ ආරක්ෂාව, තොරතුරු සහ සහභාගීත්වය ඇතුළුව සිය අයිතිවාසිකම් ගැන තේරුම් ගැනීමට
  - සංවිධානය තුළ සිටින වැඩිහිටියන් හැසිරිය යුත්තේ කෙසේදැයි දැන ගැනීමට
  - සංවිධානයේ පැමිණිලි ක්‍රියාවලිය මෙන් ම තමන්, තම මිතුරන් හෝ සම වයසේ මිතුරන් සම්බන්ධයෙන් ආරක්ෂාව සම්බන්ධ ගැටලු මතු කරන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීමට
  - දරුවන් ඉලක්ක කරගෙන පවතින උපකාරක සේවා ගැන දැනගැනීමට (3.1, 3.4)
- සංවිධානය තුළ ළමුන් දුර්වල කරන භාවිතයන් හඳුනාගෙන ඒවා වෙනස් කිරීමට කටයුතු කිරීම.(3.5, 3.6)
- කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට ළමා අපයෝජන හෝ හානි පිළිබඳ සලකුණු තේරුම් ගැනීමට, හඳුනා ගැනීමට, හා ඒ සම්බසම්බන්ධයෙන් කටයුතු කිරීමට උපකාර වන තොරතුරු සපයයි. (3.4)
- සංවිධානය විසින් අදාළ අවස්ථාවල දී, ලිංගික අපයෝජන වැළැක්වීමේ වැඩසටහන් සහ අනෙකුත් අදාළ තොරතුරු දරුවන්ට ඔවුන්ගේ වයසට ගැළපෙන සහ ප්‍රවේශ විය හැකි ආකාරයෙන් තොරතුරු සපයයි. (3.3)
- දරුවන්ට සිය අදහස් ප්‍රකාශ කිරීමට සහ ඔවුන්ට බලපාන තීරණ සම්බන්ධව සහභාගී වීමට අවස්ථාවන් සංවිධානය විසින් සකසයි. දරුවන්ගෙන් සවන් දෙන සහ ඉගෙන ගන්නා දේ ආයතනය ක්‍රියා කරන ආකාරය කෙරෙහි බලපානු ලැබේ.
- දරුවන්ට සහභාගී වීමට, සිය අදහස් ප්‍රකාශ කිරීමට මෙන් ම ගැටලු මතු කිරීමට සහාය වීම සඳහා දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීම සඳහා කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට සහයෝගය සැපයේ.
- සිය සමවයස් අය සමග සමාජ සම්බන්ධතා හා මිතුරුකම් ගොඩනගා ගැනීම, සිය සමවයස් අයට උපාකාර කිරීමට දරුවන්ගේ කුසලතා ගොඩනැගීම, හා දරුවන් අතර වන හිරිහැර කිරීම හෝ හුදෙකලා කරන චර්යාවන් අභියෝගයට ලක්කීමට සඳහා සංවිධානය විසින් දරුවන්ට උපකාර කරයි.

# 4 වැනි ප්‍රමිතිය: ළමා ආරක්ෂාව හා යහපැවැත්ම ප්‍රවර්ධනයෙහි ලා පවුල් හා ප්‍රජාවන් දැනුවත්ව හා සම්බන්ධ වී සිටියි.

**4 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධාන අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කළ යුතුය:**

4.1 සිය දරුවන් කෙරෙහි බලපාන තීරණවල දී පවුල් සහභාගී වේ.

4.2 සිය ළමා ආරක්ෂක ප්‍රවේශය සම්බන්ධයෙන් සංවිධාන විසින් පවුල් හා ප්‍රජාවන් සමග නියැලෙමින් විවෘතව සන්නිවේදනය සිදු කරන අතර අදාළ තොරතුරු වෙත ප්‍රවේශ විය හැකිය.

4.3 සංවිධානයේ ප්‍රතිපත්ති හා භාවිතයන් සකසන විට හෝ සමාලෝචනය කරන විට පවුල් හා ප්‍රජාවන්ට ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළ හැකිය.

4.4 සංවිධානයේ මෙහෙයුම් හා පාලනය සම්බන්ධයෙන් පවුල්, රැකවරණ සපයන්නන් හා ප්‍රජාව දැනුවත්ව සිටියි.

## ප්‍රධාන කරුණු

- ලේ, විවාහය, දරුකමට හදා ගැනීම, ඥාතිත්ව ව්‍යුහයන් හෝ වෙනත් දිගු පවුල් ව්‍යුහයන් මගින් සම්බන්ධ වූ අය ඇතුළුව, පවුල් විවිධාකාර වූ සබඳතාවලින් සමන්විත විය හැකිය. එදිනෙදා ජීවන කටයුතුවලට හවුල් වන හෝ ඉතා සමීප, පෞද්ගලික සබඳතාවක් බෙදා ගන්නා පුද්ගලයින් පවුල්වලට ඇතුළත් විය හැකිය.
- ප්‍රජාවන් යනු පොදු අවශ්‍යතා, අත්දැකීම්, සමාජ පසුබිම, ජාතිකත්වය, සංස්කෘතිය, විශ්වාසයන් හෝ අනන්‍යතාවය බෙදා හදා ගන්නා පුද්ගලයින් සමූහයකි.[17] සංවිධාන, පවුල් සහ දරුවන්ට ඔවුන් සමීපව ඇසුරු කරන හෝ නිතර සම්බන්ධව සිටින ප්‍රජාවන් සිටිය හැකිය. පවුල් සේ ම ප්‍රජාවන් ද විවිධ වේ.
- මාපියන්, රැකවරණ සපයන්නන් හා පවුල් ඔබේ සංවිධානය තුළට සාදරයෙන් පිළිගන්න බව ඔවුන්ට දැනිය යුතුය.[18] විවිධ ආකාරයේ පවුල්වලට ගරුත්වයක් දක්වන සියලු දෙනා ඇතුළත් වන සංස්කෘතියන් ගොඩනැගීම හා පවත්වා ගැනීම මගින් දරුවන්ට ආරක්ෂාව දැනීමට හා ආරක්ෂිතව සිටීමට උපකාරී වේ.

---

[17] කේම්බ්‍රිජ් ශබ්දකෝෂයේ අර්ථ දැක්වීම අනුසාරයෙන් සකස්කර ගෙන ඇත.

[18] සමහර විට පවුලේ සමහර සාමාජිකයන් සමග කටයුතු කිරීම නුසුදුසු වන අවස්ථාවන් තිබිය හැකිය. මෙයට උදාහරණ ලෙස, දරුවෙකු සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවලට සීමාවන් තිබීම හෝ ඇතැම් අවස්ථාවලදී, දරුවා ළමා ආරක්ෂණයට සම්බන්ධ වී සිටීම දැක්විය හැකිය. මෙවැනි අවස්ථා වලදී, අවධාරණය විය යුත්තේ පුළුල් පවුල සහ ප්‍රජාව සම්බන්ධ කර ගැනීමයි, එසේ නැතහොත් සුදුසු නම්, තමා සම්බන්ධ කර ගැනීමට කැමති කවුරුන්ද යන්න දරුවාගෙන් විමසීමයි.

- ඔබේ සංවිධානයේ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධ ගමනේ කොටසක් ඉටු කිරීමට පවුල් සහ ප්‍රජාවන් සවිබල ගැන්වීම දරුවන්ට ප්‍රයෝජනවත් වේ. මෙයින් අදහස් වන්නේ:
  - මාපියන්, රැකවරණ සපයන්නන් සහ ප්‍රජාව විසින් සංවිධානයට දරුවා සුරක්ෂිත කිරීමට උපකාර වන දේ සහ දරුවන් සුරක්ෂිතව තබා ගැනීමට උපකාර කළ හැකි ආකාරය ඉගෙන ගනු ඇත.
  - තම දරුවන් ගැන වඩාත් හොඳින් දන්නා පවුල්වල ප්‍රතිචේධනවල ආධාරයෙන් සංවිධානවලට තනි දරුවන්ට වඩාත් හොඳින් සහාය විය හැකිය.
  - දෙමව්පියන්, රැකවරණ සපයන්නන් සහ ප්‍රජාවට සවිබල ගනිවීමක් දැනෙනු ඇති අතර ඔවුන් දරුවෙකුගේ ආරක්ෂාව හෝ යහපැවැත්ම ගැන සැලකිලිමත් වන්නේ නම් කුමක් කළ යුතු දැයි දැන සිටිනු ඇත.
  - ඔබේ සංවිධානයේ ළමා ආරක්ෂක ප්‍රවේශය අඛණ්ඩව වැඩිදියුණු වනු ඇත.
- තීරණ ගැනීමේදී පවුල් සහභාගී කරවා ගැනීම යන්නෙන් අදහස් වන්නේ තීරණයක් ගැනීමට පෙර ඔවුන්ගේ මතය විමසනු ලැබීම හා එම මතය තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස සැලකීම ය. තම දරුවාගේ ආරක්ෂාවට සහ යහපැවැත්මට බලපාන තීරණ ගැන පැවසීමට ඔබේ සංවිධානය විසින් පවුල්වලට අවස්ථාව ලබා දිය යුතුය.
- ඔබේ සංවිධානයේ මෙහෙයුම් සහ පාලනය පිළිබඳව පවුල්, රැකවරණ සපයන්නන් සහ ප්‍රජාව වෙත දැනුම් දිය යුතු අතර එමඟින් ඔවුන්ට අර්ථවත් ලෙස සහභාගී විය හැකිය. ඔබේ සංවිධානය කරන්නේ කුමක්ද යන්න හා එය කෙසේ ව්‍යුහගත වී ඇත්දැයි පවුල් විසින් අවබෝධ කර ගැනීම අවශ්‍යයය. ළමා ආරක්ෂාව හා යහපැවැත්ම ගැන ඔවුන්ට ගැටලුවක් ඇත්නම්, සංවිධානය තුළ කවුරුන් ඇමතිය යුතුද යන්න ඔවුන් දැන සිටිය යුතුය.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[19]

---

[19] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

## ලේඛන

- සංවිධානයේ ප්‍රතිපත්ති මගින් පවුලේ සහ ප්‍රජා සහභාගීත්වයේ වැදගත්කම පිළිබිඹු කරන අතර මෙම සම්බන්ධතාව සිදුවිය හැකි ආකාරය විස්තර කරයි. (4.3)
- පැමිණිලි මෙහෙයවීමේ ප්‍රතිපත්තිවලට පවුල් දැනුවත් කිරීමේ ක්‍රියාපටිපාටි ඇතුළත් වන අතර රහස්‍යභාවය සහ පෞද්ගලිකත්වය පිළිබඳ වගකීම්වලට අනුකූල වන අතරම මෙය කරන්නේ කෙසේද යන්න පිළිබඳ මග පෙන්වීමක් සපයයි. (4.2 සහ 7.2ට සම්බන්ධයි)

## ක්‍රියාමාර්ග

- සංවිධානය තුළ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳව සන්නිවේදනය කිරීමෙන් ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ක්‍රියාකාරී භූමිකාවක් පවත්වා ගැනීමට පවුල් සහ ප්‍රජාවන්ට සංවිධාන මගින් සහාය සපයයි. (4.4 සහ සමස්ත ප්‍රතිඵලය)
- පහත දැක්වෙන ආකාරයෙන් සංවිධානය පවුල් හා ප්‍රජාවන් සමග විවෘත හා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතුය:
  - සංවිධානයේ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්ති සහ භාවිතයන් පිළිබඳ ප්‍රවේශ විය හැකි තොරතුරු සැපයීම (4.2 සහ 4.4)
  - සංවිධානයේ පාලනය හා මෙහෙයුම්, පැමිණිලි හසුරුවන ආකාරය සහ සංවිධානය විනය ක්‍රියාමාර්ග සහ ළමා ආරක්ෂණ අවදානම් කළමනාකරණය කරන ආකාරය පිළිබඳ තොරතුරු සැපයීම.(4.4)
- සංවිධානය විසින් ගනු ලබන තම දරුවාගේ ආරක්ෂාව සහ යහපැවැත්මට බලපාන තීරණවලට සහභාගී වීමට පවුල්වලට අවස්ථාවක් තිබේ. පවුල් සමග සන්නිවේදනය සිදු කිරීම මගින් පවුල්වල පූර්ණ විවිධත්වයට සහභාගී වීමට සහාය සැපයේ. (4.1)
- ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා සංවිධානයේ ප්‍රවේශය ඇතුළුව සංවිධානයේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන් පිළිබඳ ප්‍රතිපෝෂණ සැපයීම සඳහා පවුල්වලට සහ ප්‍රජා සාමාජිකයින්ට අවස්ථා ලබා දී තිබේ. (4.3)
- සංවිධානය විසින් පවුල්වල සහ ප්‍රජාවන්ගේ ප්‍රතිපෝෂණ සහ මැදිහත්වීම බැරෑරුම් ලෙස සලකන අතර ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගනී. (4.3 සහ 7.3ට සම්බන්ධය)

# 5 වැනි ප්‍රමිතිය: සමානාත්මතාව තහවුරු කර ඇති අතර ප්‍රතිපත්ති සහ භාවිතය තුළ විවිධ අවශ්‍යතාවලට ගරු කරනු ලැබේ

**5 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධාන විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කර ගත යුතුය:**

5.1 කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් ඇතුළු සංවිධානය විසින් ළමුන්ගේ සහ යොවුන් පුද්ගලයන්ගේ විවිධ තත්වයන් තේරුම් ගෙන, අවදානමට ලක්ව සිටින අයට සහාය සහ ප්‍රතිචාර දක්වයි.

5.2 දරුවන්ට හා යොවුන් පුද්ගලයන්ට සංස්කෘතික වශයෙන් ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි සහ තේරුම් ගැනීමට පහසු ආකාරයෙන් තොරතුරු, උපකාර සහ පැමිණිලි ක්‍රියාවලීන් පවතියි.

5.3 ආබාධිතතා සහිත දරුවන් හා යොවුන් පුද්ගලයන්, සංස්කෘතික හා භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වලින් යුත් දරුවන් හා යොවුන් පුද්ගලයන්, සිය නිවසේ ජීවත් වීමට නොහැකි අය, කාන්තා සමලිංගික, පිරිමි සමලිංගික, ද්විලිංගික, සංක්‍රාන්ති ලිංගික සහ අන්තර් ලිංගික දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව සංවිධානය විසින් විශේෂ අවධානයක් යොමු කරයි.

5.4 සංවිධානය විසින් ආදිවාසී දරුවන්ගේ සහ යොවුන් පුද්ගලයන්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අතර ඔවුන් වෙනුවෙන් සංස්කෘතික වශයෙන් ආරක්ෂිත පරිසරයක් සැලසීම/ප්‍රවර්ධනය කිරීම සිදු කරයි.

## ප්‍රධාන කරුණු

- දරුවන්ට අද්විතීය හැකියාවන්, ලක්ෂණ, කුසලතා සහ ජීවන අත්දැකීම් තිබේ. පසුබිම්වල වෙනස්කම්, පෞරුෂය සහ විශ්වාසයන් මගින් දරුවා ලෝකය අත්විඳින ආකාරය සහ ඔවුන්ට අවශ්‍ය වන දේ පිළිබඳව හැඩගස්වයි.
- විවිධත්වය අගය කරන විට හා එයට ගෞරව කරන විට දරුවන්ට ඔවුන්ගේ හැකියාවන් සපුරාලීමට අවස්ථාවන්ට ප්‍රවේශ විය හැකි බැවින්, එමගින් සංවිධාන සහ ප්‍රජාවන් ශක්තිමත් වේ.
- බැහැර කිරීම සහ වෙනස් කොට සැලකීම වැනි අයහපත් අත්දැකීම් හානිකර මෙන් ම, දරුවාට හානි හා අපයෝජන සිදු වීමේ අවදානම වැඩි කළ හැකි අතර, දරුවාට ගැටලු ඇත්නම් කතා කිරීමේ හැකියාව ද අඩු විය හැකිය.
- සමානාත්මතාව යනු ඔවුන්ගේ පසුබිම, ලක්ෂණ හෝ විශ්වාසයන් නොතකා, සියළුම දරුවන්ට නිදහසේ හා සමානව ජීවිතයේ සෑම අංශයකටම සහභාගී විය හැකි සාධාරණත්වයේ තත්වයකි. ළමා ආරක්ෂණ සංවිධාන තුළ, මෙයින් අදහස් කරන්නේ දරුවාගේ ආරක්ෂාව ඔවුන්ගේ සමාජ හෝ ආර්ථික තත්ත්වය, ඔවුන්ගේ

සංස්කෘතික පසුබිම හෝ ඔවුන්ගේ හැකියාවන් ඇතුළුව ඔවුන්ගේ තත්වයන් මත රඳා නොපවතින බවයි.

- ළමා ආරක්ෂක සංවිධානයක් විසින් විවිධත්වය හඳුනාගෙන එයට ගරු කරන අතර සමහර දරුවන් අනෙක් අයට වඩා අපයෝජනයට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති බව අවබෝධකර ගෙන සිටියි. දරුවන්ට ඔවුන්ගේ සම වයසේ මිතුරන් මෙන් ආරක්ෂිතව සිටීමට අවශ්‍ය සබඳතා, කුසලතා, දැනුම සහ සම්පත් වෙත ප්‍රවේශය සහතික කරන ප්‍රතිපත්ති සහ භාවිතයන් එහි පවතියි.
- පවතින උපකාර සහ පැමිණිලි ක්‍රියාවලීන් පිළිබඳ තොරතුරු ඇතුළුව, ප්‍රවේශ විය හැකි, සංස්කෘතික වශයෙන් ආරක්ෂිත සහ තේරුම් ගැනීමට පහසු වන තොරතුරු සැපයීම මගින් දරුවන්ගේ සන්නිවේදන අවශ්‍යතා ඔවුන්ගේ පුද්ගල හැකියාවන් සහ සංවර්ධන අවධිය මත පදනම්ව වෙනස් වන ආකාරය අවබෝධ කර ගැනීම සිදු වේ.
- ඔබේ සංවිධානයේ පැමිණිලි ක්‍රියාවලිය වෙත දරුවාගේ ඇති ප්‍රවේශය ඔවුන්ගේ පසුබිම, ලක්ෂණ හෝ ජීවන අත්දැකීම් හේතුකොට ගෙන සීමා නොකළ යුතුය. සියලුම දරුවන්ට පැමිණිලි කිරීමට හෝ ගැටලු මතු කිරීමට හැකියාව තිබීම වැදගත්ය.
- දරුවන්ගේ විවිධ තත්ත්වයන් මෙන්ම සාධාරණ සැලකීම් ලැබීමට ඇති අයිතිය ද සංවිධාන විසින් අවබෝධ කර ගත යුතුය. පහත දැක්වෙන අවශ්‍යතාවලට අවධානය යොමු කිරීමට මෙයට ඇතුළත් වේ:
  - ආබාධිතතා සහිත දරුවන් - ළමා ආරක්ෂිත සංවිධානයක් විසින් ආබාධිතතා සහිත දරුවන් සවිබල ගන්වයි. එමගින් දරුවෙකුගේ හැකියාවන් ගැන ඒකාකෘතිකරණය හෝ උපකල්පන සිදු නොකරන නමුත්, සෑම දරුවෙකු ම වෙනස් බවත් ආබාධිතතාව සහ ලෝකය වෙනස් ලෙස අත්විඳින බවත් හඳුනාගනියි.
  - සංස්කෘතිකමය සහ භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වලට අයත් දරුවන් - ළමා ආරක්ෂිත සංවිධානයක් විසින් භාෂාව සහ සංස්කෘතික අවශ්‍යතා අවබෝධ කර ගැනීමට පියවර ගන්නා අතර විවිධ පවුල් ව්‍යුහයන් සහ සම්මතයන් සැලකිල්ලට ගනියි.
  - නිවසේ ජීවත් වීමට නොහැකි අය - දරුවන්ට නිවසේ ජීවත් වීමට නොහැකි වීම සඳහා බොහෝ හේතු පවතියි. ඥාතීන් හෝ මිතුරන් සමග විධිමත් හෝ අවිධිමත් ලෙස ජීවත් වීම (ඥාති රැකවරණය), කැපකරු රැකවරණය හෝ නේවාසික රැකවරණය ඇතුළුව ඔවුන්ගේ ජීවන සැකසුම් විවිධ විය හැකිය. දරුවෙකුගේ ජීවන සැකසුම් ගැන ඔබ දැන නොසිටිය හැකි වුවත්, ඔවුන්ගේ තත්වයන් නොසලකා ඔබේ සංවිධානය සියලු දරුවන් සඳහා ආරක්ෂිත බව හා ඔවුන් සාදරයෙන් පිළිගැනෙන බව තහවුරු කර ගැනීම වැදගත්ය.

– කාන්තා සමලිංගික, පිරිමි සමලිංගික, ද්වීලිංගික, සංක්‍රාන්ති ලිංගික, අන්තර් ලිංගික, ස්ත්‍රී පුරුෂ විවිධ සහ ද්විමය නොවන දරුවන් හා යොවුන් පුද්ගලයන් - දරුවන් හා යොවුන් පුද්ගලයන් ඔවුන්ගේ ලිංගිකත්වය, ලිංගික සමාජභාවය සහ ලිංගභේදය විවිධ ආකාරවලින් අත්විඳීමට සහ ප්‍රකාශ කරනු ලැබිය හැකිය. LGBTIQ දරුවන්ට හා යොවුන් පුද්ගලයන්ට ඔබේ සංවිධානය තුළ ආරක්ෂිත බවක් දැනීමට සහ ආරක්ෂිත වීම සඳහා, ඔබ ඔවුන් සාදරයෙන් පිළිගෙන අගය කරන බව සක්‍රීයව පෙන්නුම් කළ යුතු අතර අපයෝජනයෙන් හා හානිවලින් ඔවුන් ආරක්ෂා කිරීමට ඔබ පියවර ගන්නා බව පැහැදිලි කළ යුතුය.
– ආදිවාසී දරුවන් - සිය සංස්කෘතියට හා ප්‍රජාවට සම්බන්ධ වීමට ඇති අයිතිය භුක්තිවිඳීමට, ජාතිවාදයෙන් පැන නගින හානියෙන් ආරක්ෂා වීමට, සහ සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත සේවාවන් සහ සංවිධාන වෙත ප්‍රවේශ වීමට දරුවන්ට ඇති අයිතිය සංවිධානය විසින් තහවුරු කළ යුතුය. ආදිවාසී දරුවන් වෙනුවෙන් සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් ස්ථාපනය කිරීම පිළිබඳ වැඩිදුර විස්තර සඳහා ළමා ආරක්ෂිත සංවිධානයක් නිර්මාණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය බලන්න.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[20]

### ලේඛන

- පැමිණිලි ක්‍රියාවලි හා උපකාර පිළිබඳ තොරතුරු ඇතුළුව ළමුන් සඳහා වන භාණ්ඩ ප්‍රවේශ විය හැකි, වයසට ගැළපෙන සහ අවශ්‍ය පරිදි භාෂා සහ ආකෘති පරාසයකින් ලබා ගත හැකිය. ලිඛිත ලේඛන මත පමණක්, විශේෂයෙන් අන්ධ හෝ පෙනීමේ දුර්වලතා ඇති හෝ කියවීමට නොහැකි දරුවන් සඳහා, රදා පැවතීමට නොහැකිය. (5.2)
- ළමා ආරක්ෂක හා යහපැවතුම් ප්‍රතිපත්තිය මගින් පහත දැක්වෙන දේ විස්තර කර දක්වයි:

[20] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

- සාධාරණතාව හා අන්තර්කරණය කෙරෙහි සංවිධානයේ කැපවීම (5.1)
- දරුවන්ගේ විවිධ වූ අවශ්‍යතාවන් සංවිධානය විසින් හඳුනාගන්නේ හා ඒවාට ගරු කරන්නේ කෙසේද යන්න (5.1)
- ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතා හඳුනාගැනීමට සංවිධාන විසින් දරුවන්ට හා ඔවුන්ගේ පවුල්වලට අවස්ථාව ලබා දෙන්නේ කෙසේද (5.1)
- සංස්කෘතික වශයෙන් ආරක්ෂිත, ප්‍රවේශ විය හැකි සහ තේරුම් ගැනීමට පහසු ආකාරයෙන් තොරතුරු, සහාය සහ පැමිණිලි ක්‍රියාවලීන් වෙත සංවිධානය විසින් දරුවන්ට ප්‍රවේශය ලබා දෙන්නේ කෙසේද (5.2)
- සංවිධානය විසින් සාධාරණතාව සඳහා සහයෝගය දක්වන ආකාරය මෙන් ම සියලු දරුවන්ගේ සහභාගීත්වයට සහය වීමට සහ සියලු දරුවන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සාධාරණ වෙනස්කම් සිදු කරන්නේ කෙසේද (5.1, 5.3, 5.4)
- සංවිධානය විසින් දරුවන් සඳහා සාධාරණතාවය ආරක්ෂා කරන ආකාරය සහ ආබාධිතභාවය, ජාතිය, වාර්ගිකත්වය, ආගම, ලිංගිකත්වය, අන්තර් ලිංගික තත්ත්වය, ලිංගික සමාජභාවය හෝ ලිංගික දිශානතිය මත පදනම්ව වෙනස් කොට සැලකීම නිසා ඇතිවන ළමා අපයෝජන සහ හානි වළක්වන ආකාරය. (5.1, 5.3, 5.4)

## ක්‍රියාමාර්ග

- සංවිධානය සමග සම්බන්ධ වන හෝ සම්බන්ධ විය හැකි දරුවන්ගේ විවිධ තත්වයන් සහ අවශ්‍යතා අවබෝධ කර ගැනීමට සංවිධානය පියවර ගනී. (5.1, 5.3)
- කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් වෙත:
  - දරුවන්ගේ විවිධ තත්වයන්, දරුවාට හානි කිරීමට ඇති අවදානම වැඩි කළ හැකි සාධක හඳුනා ගන්න ආකාරය මෙන් ම සියලු දරුවන් වෙනුවෙන් සාධාරණත්වය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු සහ මග පෙන්වීම ලබා දීම.
  - අවදානම් තත්ත්වයන් අත්විඳින දරුවන්ට උපකාර කිරීමට සහ ප්‍රතිචාර දැක්වීම සඳහා, අවදානම වැඩි වීමේ සලකුනු ඇති විට විභාග කිරීම හා ප්‍රතිචාර දැක්වීම ඇතුළුව, ක්‍රියාමාර්ග ගැනීම
  - සියලු දරුවන් වෙනුවෙන් සාධාරණත්වය තහවුරු කිරීමට, දරුවන්ගේ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ ළමා අපයෝජන හා හානි වැළැක්වීමට පියවර ගැනීම. (5.1, 5.3, 5.4)
- විවිධත්වය සඳහා සාධාරණත්වය සහ ගෞරවය සාක්ෂාත් කර ගැනීම සඳහා නායකයින් පැහැදිලි අපේක්ෂාවන් ගෙනහැර දක්වයි. (5.1 සහ 2.2ට සම්බන්ධයි)
- සහභාගී වීම සඳහා සියලු ම දරුවන්ට ප්‍රමාණවත් ලෙස සහයෝගය ලබා දෙන බව සංවිධානය විසින් සහතික කරයි. (5.1)

## 6 වැනි ප්‍රමිතිය: දරුවන් හා යොවුන් පුද්ගලයන් සමග වැඩ කරන පුද්ගලයින් ප්‍රායෝගිකව ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ අගයන් පිළිබිඹු කිරීමට සුදුසු වන් අතර ඒ සඳහා සහාය දක්වයි.

**6 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධානය විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කර ගත යුතුය:**

6.1 දැන්වීම් පළ කිරීම, නිර්දේශ පරීක්ෂා කිරීම සහ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන්ගේ පූර්ව රැකියා පරීක්ෂා කිරීම ඇතුළුව බඳවා ගැනීම් මගින් ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම අවධාරණය කරයි.

6.2 අදාළ කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට දැනට වලංගු දරුවන් සමග කටයුතු කිරීමේ පරීක්ෂා හෝ ඊට සමාන පසුබිම් පරීක්ෂා තිබේ.

6.3 සියලුම කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට සුදුසු හඳුන්වාදීමක් ලැබෙන අතර වාර්තා පවත්වා ගැනීම, තොරතුරු හුවමාරු කර ගැනීම සහ වාර්තා කිරීමේ වගකීම් ඇතුළුව දරුවන් සහ යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන ඔවුන්ගේ වගකීම් පිළිබඳව ඔවිහු දැනුවත්ව සිටිති.

6.4 දිගටම සිදුකරන අධීක්ෂණය හා පුද්ගල කලමනාකාරීත්වය, ළමා ආරක්ෂාව හා යහැපැවැත්ම පිළිබඳව අවධාරණය යොමු කර ඇත.

### ප්‍රධාන කරුණු

- මනා බඳවා ගැනීමේ භාවිතයන් සහ ශක්තිමත් පිරික්සුම් ක්‍රියාවලීන් මගින් දරුවන්ට සිදුවන හානි වැළැක්වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
- එක් එක් කාර්ය මණ්ඩල හා ස්වේච්ඡා තනතුරේ කාර්යභාරය සහ වගකීම් සහ ඔවුන් දරුවන් සමඟ ඇතිකර ගන්නා සම්බන්ධතාවල ස්වභාවය පිළිබඳව පැහැදිලි කර ගැනීමක් සහිතව බඳවාගැනීම් ආරම්භ වේ. මෙමගින් සංවිධානයට අයදුම්කරුවන්ගේ සුදුසුකම්, අත්දැකීම් හා උප ලක්ෂණ හඳුනාගැනීමට උදව් කරයි.
- රැකියා දැන්වීම්වල ළමා ආරක්ෂාව හා යහපැවැත්ම කෙරෙහි සංවිධානයේ ඇති කැපවීම ගැන පැහැදිලිව සඳහන් කළ යුතුය.
- දරුවන් සමග වැඩ කිරීමේ නිවාරණයේ අරමුණ වන්නේ ඇගයීමකින් අනතුරුව දරුවන්ට සාධාරණීකරණය කළ නොහැකි අවදානමක් පුද්ගලයෙකුගෙන් ඇති විය හැකි බව පෙන්නුම් කරන්නේ නම්, එවන් පුද්ගලයන් දරුවන් සමග වැඩ කිරීමට හෝ ස්වේච්ඡාවෙන් කටයුතු කිරීමට ඉදිරිපත් වීම වැළැක්වීමයි. නීතය මගින් සමහර පුද්ගලයන්ට වලංගු පරීක්ෂාවක් තිබිය යුතුය. නීතියෙන් අවශ්‍ය

නොවුවත්, සිය පරීක්ෂා ක්‍රියාවලියේ කොටසක් ලෙස පුද්ගලයින්ට වලංගු පරීක්ෂාවක් පවත්වා ගැනීම අවශ්‍ය කිරීමට සංවිධානවලට තෝරා ගත හැකිය.

- ඔබේ සංවිධානය තුළ දරුවන් ආරක්ෂිතව තබා ගැනීම සඳහා දරුවන් සමග වැඩ කිරීමේ පරීක්ෂාව ප්‍රයෝජනවත් මෙවලමකි. කෙසේ වෙතත්, එය කිසියම් තනතුරක සිටිමින් දරුවන් සමග කටයුතු කිරීමට හෝ රැකබලා ගැනීමට පුද්ගලයෙකු සතු වන යෝග්‍යතාවය තක්සේරු නොකරයි. අයදුම්කරුවෙකුගේ සුදුසුකම ඇගැයීමට උපකාර වීම සඳහා ඔවුන්ගේ අගයන් ගැන අවබෝධයක් ලබා ගැනීමට උත්සාහ කරන්න.
- නිර්දේශයන් නිසි ලෙස පරීක්ෂා කිරීමට අපොහොසත් වීම නිසා ළමා ආරක්ෂාව අනතුරට පත් කළ හැකිය. නිර්දේශ පරීක්ෂා කිරීම මගින් අයදුම්කරුගේ තොරතුරු තහවුරු කර ගැනීමට මෙන් ම සම්මුඛ පරීක්ෂණයේ දී ඔවුන්ගේ ප්‍රතිචාර පිළිබඳව ඔබට මතු වූ ගැටලු ගැන වැඩිදුර සොයා බැලීමට ඉඩ සලසයි.
- කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් ඔවුන්ගේ කාර්යභාරයන්ට හා සංවිධානය තුළට උද්ගමනය කළ යුතු අතර, එමගින් දරුවන් සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම් හා දරුවන් වෙනුවෙන් ඔවුන් ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කරන්නේ කෙසේද යන්න ඔවුන් විසින් අවබෝධ කර ගනු ඇත. ඔබේ සංවිධානයේ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය සහ අචාර ධර්ම සංග්‍රහය පිළිබඳ දළ විස්තරයක් සැපයීම මෙයට ඇතුළත් විය යුතුය.
- ඔබේ සංවිධානයේ පැමිණිලි මෙහෙයවීමේ ප්‍රතිපත්තිය, වාර්තා කිරීම, වාර්තා තබා ගැනීම සහ තොරතුරු හුවමාරු කිරීමේ වගකීම් පිළිබඳ තොරතුරු ද උද්ගමනවලට ඇතුළත් විය යුතුය. දරුවන්ගේ ආරක්ෂාව හෝ යහපැවැත්ම පිළිබඳ ගැටලුවක් ඇත්නම් කුමක් කළ යුතුද යන්න පිළිබඳව කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට පැහැදිලි තොරතුරු ලැබිය යුතුය.
- කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් සඳහා අධීක්ෂණය ලබා දීම මගින් ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම සමඟ කළමනාකරුවන් සහ එක් එක් කාර්ය මණ්ඩල හා ස්වේච්ඡා වෘත්තිකයන් අතර ප්‍රශ්න සාකච්ඡා කිරීමට සහ ගැටලු ඉදිරිපත් කිරීමට පැහැදිලි කාර්යසාධන ප්‍රමිතීන් හා නිතිපතා රැස්වීම් පැවැත්වීම ප්‍රවර්ධනය කෙරේ. නිතිපතා සිදුවන අධීක්ෂණය මගින් දරුවන්ට හානියක් වීමට පෙර කාර්ය මණ්ඩලයේ සහ ස්වේච්ඡා වෘත්තිකයන් ගේ අනාරක්ෂිත හෝ ගැටලුකාරී හැසිරීම් වලට ප්‍රතිපෝෂණ ලබා දීමට සහ ඒවා ආමන්ත්‍රණය කිරීමට කළමනාකරුවන්ට හැකියාව ලබා දෙයි.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[21]

#### ලේඛන

- තනතුරු සඳහා වන දැන්වීම්වල ළමා ආරක්ෂාව හා යහපැවැත්ම වෙනුවෙන් සංවිධානයේ වන කැපවීම ඇතුළත් කර තිබේ. (6.1)
- තනතුරු විස්තර මගින් ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් කාර්යභාරයේ අවශ්‍යතා, රාජකාරි සහ වගකීම් පිළිබඳ පැහැදිලි අපේක්ෂාවන් දක්වා ඇත. (6.1)
- සංවිධානයේ බඳවා ගැනීම, මානව සම්පත් හා ස්වේච්ඡා සේවය සැපයීමේ ප්‍රතිපත්ති මගින් පහත දැක්වෙන දේ විස්තර කර දක්වයි:
  - දරුවන් සමග කටයුතු කිරීමට සුදුසු පුද්ගලයින් පත් කිරීමට සංවිධානයට සහාය වන බඳවා ගැනීමේ භාවිතයන් (6.1)
  - සම්මුඛ පරීක්ෂණ, නිර්දේශ පරීක්ෂාව, ළමුන් සමඟ වැඩ කිරීමේ පරීක්ෂාව සහ වෙනත් ලියාපදිංචිවීම් හෝ පසුබිම් පරීක්ෂා කිරීම ඇතුළුව පූර්ව රැකියා පරීක්ෂණ භාවිතයන් (6.2)
  - සංවිධානයේ ළමා ආරක්ෂණ භාවිතයන් පිළිබඳ හැඳින්වීමක් සඳහා වන අවශ්‍යතා (6.3)
  - අධීක්ෂණය සහ පුද්ගල කළමනාකරණ භාවිතයන් දරුවන් සමඟ වැඩ කිරීම සඳහා වන පුද්ගලයෙකුගේ යෝග්‍යතාවය පිළිබඳ අඛණ්ඩ තක්සේරුවට සහාය වන ආකාරය.
- කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් සඳහා වන උද්ගමන ලියවිලිවලට පහත දැක්වෙන දේ ඇතුළත් විය යුතුය.
  - ආචාර ධර්ම සංග්‍රහය
  - ළමා ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය

[21] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

– සංවිධානයේ ළමා ආරක්ෂණ භාවිතයන් සහ පැමිණිලි ක්රියාවලිය මෙන්ම වාර්තා කිරීම, වාර්තා තබා ගැනීම සහ තොරතුරු හුවමාරු කිරීමේ වගකීම් පිළිබඳ තොරතුරු. (6.3 සහ 8.1ට සම්බන්ධයි)

## ක්රියාමාර්ග

- නව කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් බඳවා ගැනීමට පෙර, එක් එක් කාර්යභාරයට අදාළ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ අවශ්යතා ඇගයීමට ලක් කෙරේ. මෙයට පහත දැක්වෙන දේ ඇතුළත් වේ:
  - සුදුසුකම්, අත්දැකීම් හා අවශ්ය උප ලක්ෂණ
  - දරුවන් සමග ඇති රාජකාරී සහ වගකීම්
  - නිවාරණයන්, පුහුණුව සහ අධීක්ෂණ අවශ්යතා ඇතුළුව ඕනෑම ළමා අපයෝජනයක් හෝ හානි පිළිබඳ අවදානම කළමනාකරණය කිරීමට අවශ්ය පියවර. (6.1)
- අයදුම්පත්රයක්, සම්මුඛ පරීක්ෂණයක් හා නිවාරණය හරහා මතු වන ළමා ආරක්ෂාව පිළිබඳ ඕනෑම ගැටලුවක් හඳුනාගෙන කළමනාකරණය කරන්නේ කෙසේද යන්න ඇතුළුව, බඳවා ගැනීමේ ක්රියාවලියේ දී ළමා ආරක්ෂාවට ප්රමුඛත්වය දෙන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් බඳවා ගැනීමේ කාර්ය මණ්ඩලයට තොරතුරු සහ මාර්ගෝපදේශ සපයනු ලැබේ. (6.1)
- බඳවාගැනීමේ ක්රියාවලියට පහත දැක්වෙන දේ ඇතුළත් වේ:
  - දරුවන් සමග වඩා කිරීමට සුදුසු බව ස්ථාපනය කිරීමට සම්මුඛ පරීක්ෂණයේ දී අගයන් පාදක ප්රශ්න පරාසයක්
  - නිර්දේශ පරීක්ෂාව, ළමුන් සමග වැඩ කිරීමේ පරීක්ෂාව සහ වෙනත් ලියාපදිංචි හෝ පසුබිම් පරීක්ෂාව ඇතුළුව පූර්ව රැකියා පරීක්ෂා කිරීමේ භාවිතයන්
  - අවශ්ය සුදුසුකම්, ලියාපදිංචි කිරීම් සහ ළමුන් සමග වැඩ කිරීමේ පරීක්ෂාව වලංගු සහ යාවත්කාලීන බව නිවැරදි දැයි සෙවීම
  - බඳවා ගැනීමේ ක්රියාවලිය සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීම (6.1)
- අධීක්ෂණය සහ පුද්ගල කළමනාකරණයට කාර්යමණ්ඩලය අචාර ධර්ම සංග්රහයන් සහ අනෙකුත් ළමා ආරක්ෂණ ප්රතිපත්ති අනුගමනය කරන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා නිතිපත කෙරෙන සමාලෝචන ඇතුළත් වේ.
- කාර්යමණ්ඩලය හෝ ස්වේච්ඡා වෘත්තිකයන්ගේ චර්යාවන් නිසා ළමා ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවන අවස්ථාවල දී, ඔවුන් කළමනාකරණය කිරීමේ දී ගත යුතු පියවර පිළිබඳව පුද්ගල කළමනාකරුවන් වෙනුවෙන් මග පෙන්වීම සළසනු ලැබේ.
- සුදුසුකම්, දරුවන් සමඟ වැඩ කිරීමේ පරීක්ෂාව සහ අනෙකුත් ලියාපදිංචි වීම් හෝ දැනට පවතින නිවාරණ පරීක්ෂා වෙනස් වීම සහ ඒවා තවමත් වලංගු ද යන්න සඳහා නිතිපතා සමාලෝචනය කෙරේ. පුද්ගලයෙකුගේ සුදුසුකම්, දරුවන් සමග

වැඩ කිරීමේ පරීක්ෂාව හෝ වෙනත් ලියාපදිංචි වී හෝ දැනට පවතින නිවාරණයන් තවදුරටත් වලංගු නොවන විට, දරුවන්ට ඇතිවන අවදානම් කළමනාකරණය කිරීම සඳහා පියවර ගනු ලැබේ. (6.2)

- කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් එක් එක් තනතුරේ අවශ්‍යතා, යුතුකම්, අවදානම සහ වගකීම් අනුව සකස් කරන ලද උද්ගමනයක් ලැබේ. මෙම ප්‍රස්ථාපනය මගින් සංවිධානයේ ළමා ආරක්ෂණ භාවිතයන් සහ පැමිණිලි ක්‍රියාවලිය මෙන්ම වාර්තා කිරීම, වාර්තා තබා ගැනීම සහ තොරතුරු හුවමාරු කිරීමේ වගකීම් ආවරණය කරයි. (6.3)

# 7 වැනි ප්‍රමිතිය: පැමිණිලි සඳහා ක්‍රියාවලිය හා ගැටලු ළමා කේන්ද්‍රීය වේ.

**7 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධානයක් විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කර ගත යුතුය:**

7.1 සංවිධානයට, ප්‍රවේශ විය හැකි, ළමා කේන්ද්‍රීය පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තියක් ඇත. එමගින් නායකත්වයේ, කාර්යමණ්ඩලයේ හා ස්වේච්ඡා |වෘත්තිකයන්ගේ කාර්යභාරයන් සහ වගකීම්, විවිධ ආකාරයේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රවේශයන්, අදාළ ප්‍රතිපත්ති හෝ ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම් මෙන් ම ක්‍රියාත්මක වීමට සහ වාර්තා කිරීමට ඇති බැඳීම් පැහැදිලිව විදහා දක්වයි.

7.2 දරුවන් හා යොවුන් පුද්ගලයින්, පවුල්, කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් විසින් ඵලදායිව පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලීන් ගැන අවබෝධ කර ගන්නා අතර එය සංස්කෘතික වශයෙන් ආරක්ෂිත වේ.

7.3 පැමිණිලි බැරෑරුම් ලෙස සැලකෙන අතර කඩිනමින් හා පරිපූර්ණ ලෙස ඒවාට ප්‍රතිචාර දැක්වේ.

7.4 නීතිය මගින් වාර්තා කිරීම අවශ්‍ය වුවත් නැතත්, අදාළ බලධාරීන්ට පැමිණිලි සහ ගැටලු වාර්තා කරමින් නීතිය ක්‍රියාත්මක කරන්නන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට හැකි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සංවිධානය සතුව ඇත.

7.5 වාර්තා කිරීම, පෞද්ගලිකත්වය හා රැකියා නීති වගකීම් සපුරන බව.

## ප්‍රධාන කරුණු

- ළමා කේන්ද්‍රීය පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලියක් සඳහා ආයතනවලට ධනාත්මක පැමිණිලි සංස්කෘතියක් තිබීම අවශ්‍යය. මෙයින් අදහස් වන්නේ ඔබේ සංවිධානය ගැටලු වාර්තා කිරීම දිරිමත් කර සාදරයෙන් පිළිගන්න බවත්, පැමිණිලිවලට කඩිනමින්, පරිපූර්ණ ලෙස සහ සාධාරණව ප්‍රතිචාර දක්වන බවත් අවදානමට ලක්ව ඇති දරුවන් ආරක්ෂා කිරීමට ඉක්මන් පියවර ගන්නා බවත් ය.
- ඔබේ සංවිධානයේ පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය මගින් වැඩිහිටියන්ට මෙන් ම දරුවන්ට පැමිණිල්ලක් කිරීමට හෝ ළමා ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු කිරීම සඳහා ඇති ක්‍රියාවලිය ගෙනහැර දැක්විය යුතුය. මෙම පැමිණිලි ක්‍රියාවලිය දරුවන් හා වැඩිහිටියන් වෙනුවෙන් වෙනස් විය හැකිය.
- පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය මගින් වැඩිහිටියන් හා අනෙකුත් දරුවන් විසින් දරුවන්ට සිදුවන කරන චෝදිත අපයෝජන සහ හානි ආවරණය කළ යුතුය.

- පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය මගින් වාර්තා කළ යුතු විවිධ ආකාරයේ පැමිණිලි හෝ හැසිරීම් සම්බන්ධව සහ අනිවාර්ය වාර්තා කිරීමේ වගකීම් ඇතුළුව වාර්තා කළ යුතු දේ පිළිබඳව පැහැදිලි මග පෙන්වීමක් ලබා දිය යුතුය. පැමිණිලි සිදු කළ යුත්තේ කවුරුන්ට දැයි පැහැදිලිව දැක්විය යුතුය
- ඔබේ සංවිධානයේ පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාවලීන් කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට, දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට පහසුවෙන් ප්‍රවේශ විය හැකි සේ පැවතිය යුතුය. ළමයින් වෙනුවෙන් ලියවුන, සහ ඔවුන්ට ප්‍රවේශ විය හැකි ස්වාධීන ප්‍රතිපත්තියක් හෝ ක්‍රියාවලියක් සැකසීම, ඔබට තෝරා ගත හැකිය. මෙය, දරුවන්ට පැමිණිල්ලක් හෝ ගැටලුවක් ඇත්නම් ඔවුන්ට කළ හැකි දේ පිළිබඳ පැහැදිලි තොරතුරු සපයන සරල ප්‍රවාහ සරණියක් හෝ පෝස්ටරයක් විය හැකිය. පවුල් වෙනුවෙන් වෙනම තොරතුරු සැකසීම ද ඔබට තෝරා ගත හැකිය.
- පැමිණිලි සහ ආරක්ෂාව පිළිබඳ ගැටලු ඉදිරිපත් කරන හෝ අපයෝජන හෙළිදරව් කරන දරුවන්ට සංවේදීත්වයෙන් යුතුව සැලකීම සහ සහාය ලබාදිය යුතුය. කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට මග පෙන්වීම සැලසිය යුතු අතර එමගින් ඔවුන්ට එය කරන ආකාරය ගැන අවබෝධයක් ලැබේ.
- පැමිණිල්ලක් හෝ ආරක්ෂාව පිළිබඳ ගැටලුවක් මතු වූ විට, දරුවන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය දීමට පියවර ගැනීමට සංවිධානය විසින් අවධාරණය යොමු කළ යුතුය. ඔබේ සංවිධානය ගන්නා මීළඟ පියවරවලට මග පෙන්විය හැකි වන පරිදි ඕනෑම ක්ෂණික අවදානමක් ඇගයීමට ලක් කිරීම වැදගත් වේ.
- ඔබේ පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය මගින් ඔබේ සංවිධානය තුළ අභ්‍යන්තරව සහ බාහිර අධිකාරීන් වෙත හෙළිදරව් කිරීම්, පැමිණිලි සහ ආරක්ෂණ ගැටලු වාර්තා කිරීම සඳහා වන ක්‍රියාවලිය ආමන්ත්‍රණය කළ යුතුය.
- ඔබේ පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය මගින් ඔබේ සංවිධානයට පැමිණිලි විමර්ශනය කිරීමට සහාය විය යුතු අතර පවතින අවදානම් කළමනාකරණය, සාධාරණ සහ විනිවිද පෙනෙන ක්‍රියාවලීන් සහ ලබදිතාවයන් පිළිබඳ ගැටුම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ මග පෙන්වීම ඇතුළත් විය යුතුය.
- ඔබේ සංවිධානය දරුවන්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබාදෙන පරිදි පැමිණිලි සහ ගැටලුවලට ප්‍රතිචාර දැක්වීමේ කාර්යභාරයක් ඇති වික්ටෝරියා පොලිසිය, ළමා ආරක්ෂණය, කොමිෂන් සභාව සහ අනෙකුත් බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය. ඔවුන්ට විමර්ශනය කිරීමට අවශ්‍ය විය හැකි අතර සාක්ෂිකරුවන් හඳුනා ගැනීමට සහ සම්බන්ධ කර ගැනීමට සහ සාක්ෂි රැස් කර ගැනීමට හෝ රඳවා ගැනීමට ඔබේ සංවිධානය මගින් ලබාදෙන සහාය ඔවුන්ට වාසිදායක වනු ඇත.

- පැමිණිල්ලක් හෝ ආරක්ෂාව පිළිබඳ ගැටලුවක් විසඳීමේ වැදගත් කොටසක් වන්නේ පැහැදිලි ප්‍රතිඵලයක් ලබා ගැනීමය. මෙයින් අදහස් වන්නේ ඔබේ සංවිධානය ගැටලුව සහ සාක්ෂි නිසි ලෙස සලකා බැලීමෙන් පසු කුමක් කළ යුතුද යන්න පිළිබඳව තීරණයක් ගන්නා අතර, මෙම තීරණය පිළිබඳව අදාළ පුද්ගලයින්ට පවසා පසුව සුදුසු පියවර ගන්නා බවයි.
- පැමිණිලි ක්‍රියාවලිය සඳහා විශ්වසනීයත්වය පැවතීම වැදගත්ය. පුද්ගලයන්ට පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය වූ විට රහස්‍යභාවය සහ පෞද්ගලිකත්වය ගැන ගැටලු ඇති විය හැකිය. ඔවුන් නිර්නාමිකව සිටීමට කැමති විය හැකිය, නැතහොත් පොලිසිය වැනි බලධාරීන් සමඟ තොරතුරු බෙදා ගැනීමට කැමති නොවිය හැකිය. සමහර විට දරුවන් ආරක්ෂා කිරීම සඳහා හෝ පැමිණිල්ල කරන පුද්ගලයාට සාධාරණ ලෙස සැලකීමට හැකි වන පරිදි රහස්‍යභාවය පවත්වා ගත ගැනීමට නොහැකි විය හැකිය. ඔබේ පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය මගින් පැමිණිල්ලක් සිදු කළ විට රහස්‍යභාවය කළමනාකරණය කළ යුතු ආකාරය පැහැදිලි කළ යුතු වේ.
- පැමිණිල්ලකට සම්බන්ධ දරුවෙකු හෝ වෙනත් පුද්ගලයෙකු හඳුනා ගතහැකි පුද්ගලික තොරතුරු සංවිධානයට අනාවරණය කළ හැක්කේ අදාළ නීති යටතේ අවසර දී ඇති අවස්ථාවල දී පමණි.
- ඔබේ සංවිධානයේ පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාවලීන්, ඔබේ කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට අදාළ වන ඕනෑම රැකියා නීති වගකීම් සමග සමපාත විය යුතුය. වෘත්තිකයෙකුගේචර්යාව පිළිබඳ ඕනෑම පරීක්ෂණයක් සාධාරණව පැවැත්වෙන බව ඔබ විසින් සහතික කළ යුතුය.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[22]

[22] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

## ලේඛන

- පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිපත්තිය අවබෝධ කරගැනීම පහසුය, සංස්කෘතිකමය වශයෙන් ආරක්ෂිතය, ප්‍රවේශ විය හැකි අතර ළමා කේන්ද්‍රීය වේ. පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිපත්තිය
  - වැඩිහිටියන්ට හා දරුවන්ට පැමිණිල්ලක් සිදු කළ හැක්කේ කෙසේද හා සංවිධානය පැමිණිලිවලට ප්‍රතිචාර දක්වන්නේ හා කඩිනමින් පරිපූර්ණ ලෙස ඒවා විමර්ශනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව තොරතුරු ඇතුළත් වේ. (7.1, 7.2, 7.3)
  - දරුවන්ගේ, කාර්ය මණ්ඩලයේ, ස්වේච්ඡා වෘත්තිකයන්ගේ, පවුල් සහ ප්‍රජාවන්ගේ පූර්ණ විවිධත්වයට ප්‍රවේශ විය හැකි පැමිණිලි ක්‍රියාවලියක් නිර්මාණය කරයි. (7.1)
  - වැඩිහිටියන් හා අනෙක් දරුවන් විසින් දරුවන්ට කරන අපයෝජන හා හානි ආවරණය කරයි. (7.1, 7.4)
  - සංවිධානයේ අචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීම් ආවරණය කරයි. (7.1)
  - පැමිණිල්ලක් කරන අය සඳහා කුමන ආකාරයේ උදව් හා උපකාර ලබා දෙන්නේද යන්න සඳහන් සිදු කරයි. (7.1)
  - පැමිණිල්ලක් සිදු කර විමර්ශනයක් සිදු කරන විට, දරුවන් සඳහා ඇති අවදානම් කලමනාකරණය කරන්නේ කෙසේදැයි සැකෙවින් විස්තර කරයි. (9 වැනි ප්‍රමිතිය හා සම්බන්ධය)
  - වාර්තා තබා ගැනීම පිළිබඳ වගකීම් ආවරණය කරයි (7.2 හා 2.6 හා සම්බන්ධය)
  - සැපිරිය යුතු පෞද්ගලිකත්ව හා වෘත්තීමය නීති වගකීම්වලට සහයෝගය සපයයි. (7.5)
- මුද්‍රිත හෝ මාර්ගගතව පවතින ලේඛන මගින් කාර්යමණ්ඩලය, ස්වේච්ඡා වෘත්තිකයන්, දරුවන්, පවුල් හා ප්‍රජාවන් සඳහා පැමිණිලි ක්‍රියාවලිය විස්තර කරයි. (7.1, 7.2)
- වික්ටෝරියා පොලිසිය, ළමා ආරක්ෂණය සහ දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසම ඇතුළුව බලධාරීන්ට පැමිණිලි වාර්තා කළ යුත්තේ කවර අවස්ථාවක ද යන්න ගැන තොරතුරු ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවල ඇතුළත් වේ. (7.5)
- පැමිණිල්ලක් ඉදිරිපත් කළ විට, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට විනය ප්‍රතිපත්ති මගින් සංවිධානයට උපකාර කරයි.

## ක්‍රියාමාර්ග

- සංවිධානය සමග සම්බන්ධ සියලු දෙනාට දැනගත හැකි හා ප්‍රවේශ විය හැකි ලෙස පැමිණිල්ලක් සිදු කරන්නේ කෙසේද යන්න ගැන සංවිධානය විසින් තොරතුරු සකස් කරයි.
- කුමක් හා කෙසේ වාර්තා කළ යුතු ද යන්න සම්බන්ධයෙන් සංවිධානය සිය කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට මෙන්ම සංවිධානයෙන් බැහැර අධිකාරීන්ට උපකාර හා තොරතුරු ලබා දෙයි.
- පැමිණිලි බැරෑරුම් ලෙස සැලකිල්ලට ගන්නා අතර, මෙයින් අදහස් වන්නේ සංවිධානය විසින් නිරන්තරයෙන් පහත දැක්වෙන දේ සිදු කරන බවයි:
  - දරුවන් සඳහා වන අවදානම් හඳුනාගනිමින් ඒවා කළමනාකරණ කිරීම
  - පැමිණිලිවලට කඩිනමින් හා පරිපූර්ණ ලෙස ප්‍රතිචාර දැක්වීම
  - දරුවන්ගේ ආරක්ෂාව ප්‍රමුඛකොට සලකමින් පෞද්ගලිකත්ව හා වෘත්තීමය නීති වගකීම් සැපිරීම
  - පැමිණිලි ක්‍රියාවට සම්බන්ධව සිටින සියලු දෙනාට උපකාර කිරීම
  - දරුවන් සම්බන්ධයෙන් වන චෝදිත අපයෝජන හෝ හානි සහ ළමා ආරක්ෂාව පිළිබඳව ඇති ගැටලු බලධාරීන්ට පැමිණිලි කරමින් නීති ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දෙයි. (7.1, 7.3, 7.4, 7.5 හා 9 වැනි ප්‍රමිතිය හා සම්බන්ධය)
- දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු ඉදිරිපත් කර ඇති අවස්ථා, දරුවන් සම්බන්ධයෙන්දි වන චෝදිත අපයෝජන හා හානි මෙන් ම ඒවාට ප්‍රතිචාර ලෙස ගෙන ඇති ක්‍රියාවන් ඇතුළුව සංවිධානය වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් වාර්තා තබා ගනියි
- පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සැලසුම් කිරීමේ දී හා සමාලෝචනය කිරීමේ දී දරුවන්, පවුල් හා ප්‍රජාවන් වෙතින් අදහස් විමසනු ලැබේ. (7.2 හා 4.3ට සම්බන්ධය)
- සංවිධාන විසින් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳව විධිමත් කාල අන්තරවල දී සමාලෝචනය කිරීම සිදු කරයි. (7.1 හා 10.1 සමඟ සම්බන්ධය)

## 8 වැනි ප්‍රමිතිය: දරුවන් හා යොවුන් පුද්ගලයන් ආරක්ෂිතව තබා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයෝ අඛණ්ඩව අධ්‍යාපනය සහ පුහුණුව තුළින් දැනුම, කුසලතා සහ දැනුවත්භාවයෙන් සන්නද්ධව සිටිති.

**8 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධායක් විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ තහවුරු කර ගත යුතුය:**

8.1 සංවිධානයේ ළමා ආරක්ෂණ හා යහපැවතුම් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් හට පුහුණුව හා සහාය ලබා දෙයි.

8.2 කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට අනෙකුත් දරුවන් සහ යොවුන් පුද්ගලයන් විසින් සිදුකරන හානි ඇතුළුව ළමා හානි පිළිබඳ දර්ශක හඳුනා ගැනීමට පුහුණුව සහ තොරතුරු ලබා දෙයි.

8.3 කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ගැටලුවලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සහ හානි හෙළි කරන සගයන්ට සහාය වීම සඳහා පුහුණුව හා තොරතුරු ලබා දෙයි.

8.4 කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට දරුවන් සහ යොවුන් පුද්ගලයන් සඳහා සංස්කෘතික වශයෙන් ආරක්ෂිත පරිසරයක් ගොඩනඟන්නේ කෙසේද යන්න පිළිබඳ පුහුණුව සහ තොරතුරු ලැබෙයි.

### ප්‍රධාන කරුණු

- සංවිධානයක කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් නිසි ලෙස දැනුවත් කර, පුහුණු කර සහාය ලබා දෙන විට, ඔවුන් සංවිධානයේ ළමා සුරක්ෂිත වටිනාකම් ආරක්ෂා කිරීමට වැඩි ඉඩක් ඇති අතර සිය කළමනාකරුට හෝ ළමා ආරක්ෂණ පුද්ගලයාට ගැටලු ගැන වාර්තා කිරීමට වැඩි ඉඩක් ඇත.
- ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තියක් තිබීම මගින් පමණක්, දරුවන් අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා නොවේ. සංවිධාන විසින් දරුවන් සුරක්ෂිතව තබා ගැනීම සඳහා තම කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් දැනුම හා කුසලතාවලින් සන්නද්ධ කළ යුතුය. මෙයින් අදහස් වන්නේ කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට අඛණ්ඩව අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම මගින් සිය කාර්යභාරයන් ඉටු කිරීමේදී ඔවුන්ට ඒවා උපයෝගී කර ගත හැකි බවය.
- ළමා ආරක්ෂණ සංවිධානයක් විසින් එහි කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට දරුවෙකු අපයෝජනය හෝ හානි අත්විඳින බවට වන සලකුණු

හඳුනා ගැනීමට සහාය වේ. දරුවෙකු තමන්ට හානියක් වන්නේ නම් සමහර විට එය යමෙකුට පැවසීමේ හැකියාවක් ඇති නමුත්, වෙනත් අවස්ථාවල දී කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට හැසිරීමේ, හැඟීම්වල හෝ ශාරීරික පෙනුමේ වෙනස්කම් ගැන සොයා බැලීමට සිදුවනු ඇත.

- ළමා ආරක්ෂණ සංවිධානයක් විසින් එහි කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට පුහුණුව සහ තොරතුරු ලබා දෙන අතර එමගින් දරුවන්ට සහාය වීම සහ ඔවුන් කරන ඕනෑම හෙළිදරව්වකට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව ළමා යහපැවැත්ම සහ ආරක්ෂාව පිළිබඳ ගැටලු සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ලබා දෙයි.
- දරුවෙකුට සිදුවන හානිය පිළිබඳ හෙළිදරව් කිරීම් අසන්නට ලැබීම, කනස්සලුදායක මෙන් ම ආතතිය ඇති කරවන සුළු විය හැකිය. මෙයින් අදහස් වන්නේ කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට ඔවුන්ට මග පෙන්වීම හා සහාය ලබා ගත හැක්කේ කාගෙන්ද යන්න සහ ඔවුන්ගේ සගයන්ට සහාය වන්නේ කෙසේද යන්න ගැන දැන ගැනීම ප්‍රයෝජනවත් බවයි.
- ආදිවාසී පුද්ගලයන්ට සහ සංස්කෘතික හා භාෂාමය වශයෙන් විවිධ පසුබිම්වල සිටින පුද්ගලයින්ට ඔවුන්ගේ සංස්කෘතියට හා අනන්‍යතාවයට ගරු කරන බවත්, ජාතිවාදය නොඉවසන බවත්, තමන්ම වීම මගින් ඔවුන්ට ආරක්ෂිත බවක් දැනෙන බවත් සහතික කර ගැනීමට ක්‍රියාකාරී පියවර ගැනීම සඳහා කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට මග පෙන්වීම අවශ්‍ය වේ.
- හානි පිළිබඳ දර්ශක ඇතුළු ළමා ආරක්ෂණ ගැටලු පිළිබඳව කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට පුහුණුව සහ තොරතුරු ලබා දීම ගැටුම්කාරී, විශේෂයෙන් ළමා නොනැසී සිටින අය වෙනුවෙන්, විය හැකිය. ක්ෂති දැනුවත් ප්‍රවේශයක් යනු පුද්ගලයෙකුට කම්පන සහ ආතතියේ බලපෑම් අවබෝධ කර ගැනීම සහ සපයනු ලබන තොරතුරුවල ස්වභාවය සහ එය සපයන ආකාරය පිළිබඳව සංවේදී වන ප්‍රවේශයකි. මෙමගින් තව දුරටත් වන හානිවලින් පුද්ගලයින් ආරක්ෂා කිරීමට උත්සාහ කරයි.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[23]

---

[23] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල

## ලේඛන

- කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් වෙනුවෙන් වන පුහුණු ක්‍රියාකාරකම් සැලැස්මක පහත දැක්වෙන දේ ඇතුළත් වේ:
  - ළමා ආරක්ෂණ හා යහපැවතුම් ප්‍රතිපත්තිය (8.1)
  - ළමා අපයෝජන හා හානි පිළිබඳ දර්ශක හඳුනාගැනීම (8.2)
  - දරුවකුට සිදුවන හානි සම්බන්ධයෙන් අනාවරණය කරන පුද්ගලයෙකුට උපකාර කළ හැකි ආකාරය (8.3)
  - අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණ අවශ්‍යතා, පවුල්වලට හා රැකවරණ සපයන්නන්ට දැනුම් දීම සහ දරුවන්ට ඇති අවදානම කළමනාකරණය කිරීම ඇතුළුව ළමා ආරක්ෂාව පිළිබඳ ගැටලු වලට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය
  - සංස්කෘතික ආරක්ෂාවට සහාය දැක්විය හැකි ආකාරය (8.4)
- කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් වෙනුවෙන් වන මග පෙන්වීම් (ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, මාර්ගෝපදේශ, තොරතුරු පත්‍රිකා සහ පෝස්ටර් වැනි) මගින් පහත දැකිවෙන දේ පිළිබඳ මාර්ගෝපදේශ සපයයි:
  - වෙනත් දරුවන් විසින් සිදු කෙරෙන ඒවා ද ඇතුළව, ළමා අපයෝජන හා හානි පිළිබඳ දර්ශක හඳුනාගැනීම (8.2)
  - අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණ අවශ්‍යතා, පවුල්වලට හා රැකවරණ සපයන්නන්ට දැනුම් දීම සහ දරුවන්ට ඇති අවදානම කළමනාකරණය කිරීම ඇතුළුව ළමා ආරක්ෂාව පිළිබඳ ගැටලු වලට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය
  - දරුවකුට සිදුවන හානි සම්බන්ධයෙන් අනාවරණය කරන පුද්ගලයෙකුට උපකාර කළ හැකි ආකාරය (8.3)
  - සංවිධානය තුළ සංස්කෘතියමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් සකසන ආකාරය (8.4)
- පුහුණුවීම සිදු කෙරීමේ රෙජිස්ටරයක් මගින් කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් විසින් සිදු කරන ලද පුහුණුවීම් අවසන් කිරීම ගැන වාර්තා කරයි. (8.1, 8.2, 8.3, 8.4)

## ක්‍රියාමාර්ග

- ළමා ආරක්ෂක පුහුණුව අනිවාර්ය බව නායකයින් විසින් කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට සන්නිවේදනය කරයි. (8.1, 8.2, 8.3, 8.4)
- කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට ළමා ආරක්ෂක හා යහපැවතුම් ප්‍රතිපත්තිය ගැන නියමිත කාල සීමාවල දී පුහුණුව ලබා දේ. (8.1)

---

විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

- කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට ඔවුන්ගේ පහත දැක්වෙන හැකියාවන්ට උපකාර වන පුහුණුව ලබා දෙයි:
  - ළමා අපයෝජන හා හානි ඇති වීමේ සංඥා හඳුනාගැනීම (8.2)
  - අභ්‍යන්තර හා බාහිර වාර්තාකරණ අවශ්‍යතා, පවුල් සහ රැකවරණ සපයන්නන් දැනුවත් කිරීම සහ දරුවන්ට ඇති අවදානම් කළමනාකරණය කිරීම ඇතුළු ළමා ආරක්ෂාව පිළිබඳ ගැටලු වලට ප්‍රතිචාර දැක්වීම
  - දරුවන්ට සිදුවන හානි අනාවරණය කරන පුද්ගලයෙකුට සහයෝගය දැක්වීම
  - සංවිධානය තුළ සංස්කෘතියමය වශයෙන් ආරක්ෂිත පරිසරයක් සකස් කිරීම (8.4)
- ළමා ආරක්ෂාව පිළිබඳ වන පුහුණුව හා මග පෙන්වීම:
  - දරුවන් සමග සංවිධානය සිදු කරන නියැලීමට උචිත වන පරිදි හා සංවිධානය තුළ දරුවන්ගේ අවශ්‍යතා අනුව
  - ක්ෂිතය ගැන දැනුවත්
  - කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට ඔවුන්ගේ කුසලතා සහ දැනුම යාවත්කාලීනව තබා ගැනීමට හැකි වන පරිදි නිතිපතා පිරිනමනු ලැබේ
  - කාර්යක්ෂමව පවත්වා ගැනීමට නිතිපතා සමාලෝචනය කර යාවත්කලීන කරනු ලැබේ. (8.1, 8.2, 8.3, 8.4)
- කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් පිළිබඳ අධීක්ෂණයට සහ කළමනාකරණයට ළමා ආරක්ෂණ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම ඇතුළත් වේ. (8.1, 8.2, 8.3, 8.4)

# 9 වැනි ප්‍රමිතිය: දරුවන්ට හා යොවුන් පුද්ගලයන්ට හානි සිදු වීමට ඇති අවස්ථා අවම කරමින්, භෞතික සහ මාර්ගගත පරිසරයන් මගින් ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කරයි

**9 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වීමේ දී, සංවිධානය විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කර ගත යුතුය:**

9.1 කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් විසින් ළමා පෞද්ගලිකත්වය, තොරතුරු වෙත ප්‍රවේශය, සමාජ සම්බන්ධතා සහ ඉගෙනීමේ අවස්ථා සඳහා දරුවට ඇති අයිතියට බාධා නොකර මාර්ගගත සහ භෞතික පරිසරයන් තුළ අවදානම් හඳුනාගෙන ඒවා අවම කරයි.

9.2 සංවිධානයේ ආචාර ධර්ම සංග්‍රහය සහ ළමා ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්ති සහ භාවිතයන්ට අනුකූලව මාර්ගගත වටපිටාව උපයෝගී කර ගනු ලැබේ.

9.3 අවදානම් කළමනාකරණ සැලසුම් මගින් ආයතනික සැකසුම, ක්‍රියාකාරකම් සහ භෞතික පරිසරය නිසා ඇතිවන අවදානම් සලකා බලයි.

9.4 තෙවැනි පාර්ශ්වයන්ගෙන් කොන්ත්‍රාත් පහසුකම් සහ සේවා ලබාගන්නා සංවිධානවලට දරුවන්ගේ හා යොවුන් පුද්ගලයන්ගේ ආරක්ෂාව සහතික කරන ප්‍රසම්පාදන ප්‍රතිපත්ති තිබේ.

## ප්‍රධාන කරුණු

- සංවිධානවල පවතින අවදානම හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම දරුවන් හානිවලින් ආරක්ෂා කර ගැනීමේ මූලික පියවරක් වේ. අවදානම් කළමනාකරණ ප්‍රවේශයක් අනුගමනය කිරීම මගින්, සංවිධානයකට දරුවන්ට හානි හෝ අපයෝජනවලට ලක්වීමට ඇති ඉඩකඩ සක්‍රීයව අඩු කළ හැකිය.
- ළමා ආරක්ෂක ප්‍රමිතිවල අරමුණ සඳහා, ‘අවදානම’ යන්නෙන් අදහස් වන්නේ සංවිධානයක් පිළිබඳව ගත් කල දරුවෙකුට හානියක් හෝ අපයෝජනයක් සිදුවීමේ හැකියාවයි. සංවිධානයෙන් හෝ ඊට සම්බන්ධ පුද්ගලයන්ගෙන් දරුවන්ට ඇති අවදානම්, සංවිධානය විසින් සිදු කරන ක්‍රියාකාරකම් හේතුවෙන් පැන නගින අවදානම සහ එහි භෞතික හා මාර්ගගත පරිසරයන් තුළ දී පැන නගින අවදානම මෙයට ඇතුළත් වේ.
- සියලුම සංවිධාන විසින් ඔවුන් සමග සම්බන්ධ වන දරුවන්ට ඇති විය හැකි අවදානම් විශ්ලේෂණය කර අවබෝධ කර ගත යුතුය. ආයතනික ව්‍යුහය හා සංස්කෘතිය, ක්‍රියාකාරකම්, භෞතික හා මාර්ගගත පරිසරයන් විසින් නිර්මාණය

කරනු ලබන අවදානම ගැන සලකා බැලීම මෙන් ම නව අවදානම පැනනගින විට ඒවා ආමන්ත්‍රණය කිරීම ද වැදගත් වේ.

- අවදානම හඳුනා ගැනීමේ දී හා කළමනාකරණයේ දී, යම් ක්‍රියාකාරකමක හෝ ප්‍රවේශයක දරුවන්ට ලැබෙන ප්‍රතිලාභවලට එරෙහිව හානි සහ අපයෝජන අවදානම කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය සමතුලිත කිරීම වැදගත් වේ.
- මාර්ගගත තාක්ෂණය නිරන්තරයෙන් වෙනස් වන අතර, මෙම වෙනස්කම් වලට අනුවර්තනය වීමේ දී දරුවෝ බොහෝ විට දෙමාපියන්, රැකවරණ සපයන්නන් සහ ආයතනික කාර්යමණ්ඩලයට වඩා ඉදිරියෙන් සිටිති. මාර්ගගත හැසිරීම් සම්බන්ධයෙන් ඔබේ සංවිධානයේ ආචාර ධර්ම සංග්‍රහයෙන් ආවරණය කළ යුතු අතර, ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්ති සහ භාවිතයන් මාර්ගගත පරිසරයට ද ආමන්ත්‍රණය කළ යුතුය.
- තෙවැනි පාර්ශ්ව සමග ඇති විධිවිධාන හා ගිවිසුම් මගින් ද ළමා ආරක්ෂාවට අවදානමක් ඇති විය හැකිය. ඔවුන් විසින් නාඳුනන පුද්ගලයින්, හෝ එකම මට්ටමේ ළමා ආරක්ෂණ නිවාරණයකට යටත් නොවන පුද්ගලයින් සංවිධානයට සම්බන්ධ දරුවන් සමග කටයුතු කිරීමට රැගෙන ඒම සිදු විය හැකිය.
- සංවිධානයට සම්බන්ධ දරුවන්ට තුන්වන පාර්ශවයන් නිසා ඇති විය හැකි ඕනෑම අවදානමක් ගැන සංවිධාන විසින් සලකා බලා, හඳුනාගෙන කළමනාකරණය කළ යුතුය.
- සංවිධානවලට සිය ළමා ආරක්ෂණ අවදානම් ඇගයීම් සහ කළමනාකරණ සැලැස්ම සම්පූර්ණ කිරීමට උපකාර කිරීම සඳහා අවදානම් ඇගයීම සහ කළමනාකරණ ටෙම්ප්ලේට සකස් කර ඇත.

## අනුකූලතා දර්ශක

**මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?**

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[24]

---

24 ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

## ලේඛන

- අවදානම් ඇගයීමක් මගින් සංවිධානයට සම්බන්ධ භෞතික හා මාර්ගගත පරිසරයන් තුළ දී ළමා අපයෝජන හා හානි සම්බන්ධයෙන් ඇති අවදානම් හඳුනා ගනියි. (9.1, 9.3)
- අවදානම් කළමනාකරණ සැලසුම් මගින් ළමා අපයෝජන සහ හානි පිළිබඳ හඳුනාගත් එක් එක් අවදානම වැළැක්වීමට හෝ අඩු කිරීමට සංවිධානය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග ලැයිස්තුගත කර දක්වයි. (9.3)
- ආචාර ධර්ම සංග්‍රහය සහ ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තිය මගින් සංවිධානය විසින්, ඉහළ අවදානම් සහිත ක්‍රියාකාරකම් සඳහා සුවිශේෂ සඳහනක් සහිතව, දරුවන් භෞතික සහ මාර්ගගත පරිසරයන් තුළ දී ආරක්ෂිතව තබා ගන්නේ කෙසේද යන්න හඳුනා ගනීයි. (9.2, 9.3)
- තෙවන පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ ප්‍රසම්පාදන ප්‍රතිපත්ති මගින් සංවිධානයේ ආචාර ධර්ම සංග්‍රහය සහ ළමා ආරක්ෂාව හා යහපැවැත්ම ප්‍රතිපත්තිවලට අනුකූල වීමට අවශ්‍ය වීම වැනි ළමා අපචාර හා හානි අවදානම්වලින් දරුවන් ආරක්ෂා කිරීමට ක්‍රියාවලි සකස් කිරීම සිදු කරයි. (9.4)

## ක්‍රියාමාර්ග

- අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණ සැලසුම් කාර්ය මණ්ඩලයේ, ස්වේච්ඡා වෘත්තිකයන් හා දරුවන්ගේ අදහස් සහ ගැටලුවලින් මගින් දැනුම්වත් කර ඇති ඒවාට ප්‍රතිචාර දක්වයි. දරුවන්ගේ පෞද්ගලිකත්වය, තොරතුරු වෙත ප්‍රවේශය, සමාජ සම්බන්ධතා සහ ඉගෙනීමේ අවස්ථා සඳහා වන අයිතිවාසිකම්වලට එරෙහිව සිදුවන හානි සහ අපයෝජන ඇති වීමේ අවදානම කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය සංවිධානය විසින් සමතුලිත කර ඇති බව සැලසුම් මගින් පෙන්වා දෙයි. (9.1, 9.3)
- කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට අවදානම කළමනාකරණ සැලසුම් සපයා ඇති බැවින් ඔවුහු ළමා අපයෝජන හා හානි සම්බන්ධ අවදානම් පිළිබඳව දැනුවත්ව සිටින අතර ඒවා වැළැක්වීමට සහ අඩු කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග මොනවාදැයි දැන සිටිති. (9.1)
- ළමා අපයෝජන හා හානි හඳුනාගත් විට ඒවා වැළැක්වීම සහ අවම කිරීම සඳහා සංවිධානයේ කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා වෘත්තිකයන් විසින් පියවර ගනු ලැබේ. (9.1)
- අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණ සැලසුම් යාවත්කාලීනව තබා ගැනීම සහ පැමිණිලි, ගැටලු සහ ආරක්ෂිත සිදුවීම් ආශ්‍රිත පාඩම් ඇතුළත් කිරීම සඳහා, ඒවා නිතිපතා සමාලෝචනය කෙරේ. (9.1, 9.2)

- සංවිධානයේ නායකත්වය සහ පාලන විධිවිධාන මගින් අවදානම් තක්සේරුව සහ කළමනාකරණය, ළමා අපචාර හා හානි හඳුනා ගැනීම, වැළැක්වීම සහ අවම කිරීම කෙරෙහි අවධානය යොමුකර ඇති බව සහතික කරයි. (2.5ට සම්බන්ධයි)
- තෙවැනි පාර්ශ්වයන් සමග එකඟතාවලට පැමිණෙන විට, තුන්වන පාර්ශවය විසින් අපේක්ෂිත ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ ප්‍රමිතීන් සපුරාලන්නේ නැතිනම්, ඒ ගැන ක්‍රියාමාර්ග ගැනීමට සංවිධානයට අවසර දෙන කොන්දේසි කොන්ත්‍රාත්තුවේ ඇතුළත් වේ. (9.4)
- තෙවැනි පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධව කරගත් විට, තෙවැනි පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන්ගේ නියුතු වීම මගින් ළමා අපයෝජන හා හානි ඇති වීමේ අවදානමක් තිබේ ද යන්න සහ එහි ප්‍රමාණය තක්සේරු කිරීමට සංවිධානය විසින් පියවර ගනු ලැබේ. (9.4)
- තෙවැනි පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන් විසින් ඇති කරන අවදානම් මට්ටම අනුව, සංවිධානය විසින් ළමා අපචාර හෝ හානි වැළැක්වීමට හෝ අඩු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. උචිත ක්‍රියාමාර්ගවලට පහත දැක්වෙන දේ ඇතුළත් වේ:
  – සංවිධානයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ගවලට තෙවැනි පාර්ශව කොන්ත්‍රාත්කරුවන් විසින් අනුකූල වීමේ අවශ්‍යතාව
  – තෙවැනි පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන් විසින් ළමා ආරක්ෂණ ප්‍රමිති සහ/හෝ සංවිධානයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමඟ අනුකූල වීම අධීක්ෂණය කිරීම
  – ළමා අපචාර හා හානි හඳුනා ගැනීම, වැළැක්වීම සහ අවදානම අවම කිරීම සඳහා තෙවන පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන් සමග කටයුතු කිරීම
  – තෙවැනි පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරනු ලබන ළමා අපචාර සහ හානි පිළිබඳ අවදානම සංවිධානයට ප්‍රමාණවත් ලෙස කළමනාකරණය කිරීමට නොහැකි අවස්ථාවල දී, කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හෝ දරුවන් ආරක්ෂා කිරීම සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව සලකා බැලීම. (9.4)
- සුදුසු නම්, කාර්යමණ්ඩලය, ස්වේච්ඡා සේවකයන්, දෙමාපියන්, රැකබලා ගන්නන් සහ දරුවන් වෙත මාර්ගගත ආරක්ෂාව සහ මාර්ගගත පරිසරය තුළ ඇති අවදානම්, මර්ගාගත් හැඩගැන්වීම්, සයිබර් අවකාශයේ හිරිහැර කිරීම් සහ ලිංගික කෙටිපණිවුඩ වැනි, පිළිබඳ තොරතුරු සැපයීම. ඍනාත්මක අත්දැකීම් හා ගැටලු වාර්තා කිරීමට සහයෝගය ලබා දේ (9.2)

# 10 වැනි ප්‍රමිතිය: ළමා ආරක්ෂක ප්‍රමිති ස්ථාපනය කිරීම නිතිපතා සමාලෝචනය කර වැඩිදියුණු කෙරේ.

**10 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධානයක් විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කළ යුතුය: .**

10.1 සංවිධානය විසින් නිරන්තයෙන් ළමා ආරක්ෂණ භාවිතයන් සමාලෝචනය කිරීම, ඇගයීම සහ වැඩිදියුණු කිරීම කරයි.

10.2 අඛණ්ඩ වැඩිදියුණු කිරීම් ගැන දැනුවත් කිරීම සඳහා හේතු සහ පද්ධතිමය අසාර්ථකත්වය හඳුනා ගැනීම වෙනුවෙන් පැමිණිලි, ගැටලු සහ ආරක්ෂක සිදුවීම් විශ්ලේෂණය කරනු ලැබේ.

10.3 සංවිධානය විසින් කාර්යමණ්ඩලයට සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට, ප්‍රජාවට සහ පවුල්වලට මෙන් ම දරුවන්ට හා යොවුන් පුද්ගලයන්ට අදාළ සමාලෝචනවල සොයාගැනීම් පිළිබඳව වාර්තා කරයි.

## ප්‍රධාන කරුණු

- ළමා ආරක්ෂිත සංවිධානයක් ලෙස කටයුතු කිරීම, තනි ව්‍යායාමයක් ලෙස සාක්ෂාත් කරගත නොහැකි අතර ඒ සඳහා අඛණ්ඩ උත්සාහයක් අවශ්‍ය වේ. ළමා ආරක්ෂිත සංවිධානවලට විවෘත හා විනිවිදභාවයෙන් යුතු සංස්කෘතියක් ඇති අතර ඔවුහු සිය වැරදිවලින් ඉගෙන ගෙන දරුවන්ගේ අවශ්‍යතාවලට මුල් තැන දෙති.
- ඔබේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන් ප්‍රමාණවත්, යාවත්කාලීන සහ ඵලදායි ද යන්න මෙන් ම ඒවා සම්පූර්ණයෙන් ම ක්‍රියාවට නංවන බව සහ සියලු දෙනා විසින් අනුගමනය කරන බව නිතිපතා සමාලෝචන මගින් පරීක්ෂා කළ යුතුය.
- යාවත්කාලීන සහ ඵලදායී ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පවත්වා ගැනීමට වාර්ෂික සමාලෝචනයක් කිරීම මනා භාවිතයකි. වේගයෙන් වෙනස්වල පරිසරයක් තුළ, වඩාත් නිරන්තර සමාලෝචන අවශ්‍ය විය හැකිය.
- පැමිණිලි, ගැටලු සහ ආරක්ෂක සිදුවීම් දෙස බැලීම සමාලෝචනයක් සඳහා ඉතා වැදගත් වන්නේ එමගින්, ඔබේ සංවිධානයේ ළමා ආරක්ෂණ පද්ධති සහ භාවිතයන්හි සඵලතාවය පිළිබඳ තොරතුරු සපයන අතර, වැඩිදුර අපයෝජන හෝ හානි වැළැක්වීම සඳහා වෙනස්කම් අවශ්‍ය දේවල් හඳුනා ගැනීමට උදවු කළ හැකි නිසාය.
- පැමිණිලි, ගැටලු හා ආරක්ෂක සිදුවීම් පිළිබඳ ඔබේ විශ්ලේෂණය මගින් පහත දැක්වෙන දේ ගැන සලකා බැලිය යුතු වේ.
  - එක් එක් කරුණට පාදක වී ඇති හේතු හා ගැටලු

- ඔබගේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි හෝ භාවිතයන් සම්බන්ධයෙන් හිඩැස් හෝ අසාර්ථකත්වයන් පිළිබඳ කිසියම් ඇඟවීම් පවතින්නේ ද යන්න
- හැසිරීම්, භාවිතයන්, සිදුවීම් හෝ අතපසුවීම් පිළිබඳ වන රටා
- ඔබේ සංවිධානයේ ළමා ආරක්ෂිත ප්‍රතිපත්ති අනුගමනය කරන්නේ කෙසේද යන්න ඔබේ සංවිධානයේ පුද්ගලයන්ට නොතේරෙන බවට කිසියම් ඇඟවීමක්
- හඳුනාගත් ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා වෙනස්කළ යුතු දේවල්.

• සමාලෝචනයෙන් සොයා ගත් දේ ගැන වාර්තා කරන විට, පහත දැක්වෙන කරුණු ගැන සලකා බැලිය යුතුය:
  - සොයාගැනීම් වඩාත් වත්මන් හා අර්ථවත් ලෙස පවතින පරිදි, ඒවා කඩිනමින් හුවමාරු කර ගැනීම
  - සොයාගැනීම් වයසට උචිත ආකාරවලින් සන්නිවේදනය කිරීම සහ ඒවාට ප්‍රවේශ වීමට සහ තේරුම් ගැනීමට පහසු බව සහතික කිරීම
  - සමාලෝචනවලින් උගත් දෑ හුවමාරු කර ගැනීම, සහ ළමා ආරක්ෂිත භාවිතයන් හෝ පද්ධති වෙනස් කිරීමට හෝ යාවත්කාලීන කිරීමට ඇති යම් සැලසුම් සහ වෙනස්කම් සිදු වන විට, හා/හෝ වැඩිදුර සමාලෝචන කිරීම් විදහා දැක්වීම.
  - පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමට සහ නීතියෙන් අවශ්‍ය පරිදි එසේ නැත්නම් ඔබ කිරීමට කැපවී සිටින පරිදි රහස්‍යභාවය පවත්වා ගැනීමට මතක තබා ගන්න
  - සමාලෝචනයක් පිළිබඳ ප්‍රසිද්ධියේ වාර්තා කිරීම, යොමු කර ඇති යම් සිදුවීම්වලට සම්බන්ධ පාර්ශ්වයන්ට බලපාන්නේ කෙසේද යන්න සලකා බලන්න - විශේෂයෙන් ම වාර්තාව ප්‍රකාශයට පත් කරන බවට ගැලවී සිටින වින්දිතයන් හට දැනුම් දීමේ අවශ්‍යතාවය ගැන සලකා බලන්න.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[25]

[25] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

### ලේඛන

- සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට ලේඛනයේ දක්වා ඇති පරිදි නිතිපතා කෙරෙන සමාලෝචන කාල සීමාවක් ඇත. (10.1)
- සියලු ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳ සමාලෝචන සහ සොයාගැනීම් ලේඛනගත කිරීම වාර්තා කෙරේ. (10.3)

### ක්‍රියාමාර්ග

- පැමිණිලි, ගැටලු, චෝදනා සහ ප්‍රතිචාර දැක්වීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පවත්වාගෙන ඇත. (10.1, 10.2, 10.3)
- ගැටලුවට හේතු වූ දේ සහ ගැටලුවට දායක වූ සංවිධානයේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ භාවිතයන්හි කිසියම් දෝෂයක් තිබේද යන්න අවබෝධ කර ගැනීමට පැමිණිලි, ගැටලු, ආරක්ෂක සිදුවීම් හෝ ප්‍රතිපත්ති කඩ කිරීම් (ආචාර ධර්ම සංග්‍රහය වැනි) පරීක්ෂා කිරීම සිදු වේ. දෝෂ හෝ අසාර්ථකත්වයන් හඳුනාගෙන ඇති විට, ගැටලුව නැවත ඇතිවීම වැළැක්වීම සඳහා වැඩිදියුණු කිරීම් සිදු කරනු ලැබේ. (10.1, 10.2)
- සංවිධානය නිතිපතා ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ළමා ආරක්ෂණ භාවිතයන් නිතිපතා සමාලෝචනය කරන අතර, පහත දැක්වෙන කරුණු සලකා බලමින් වැඩිදියුණු කිරීම් සිදු කරයි.
  - පැමිණිලි, ගැටලු, ආරක්ෂක සිදු වීම් හා ප්‍රතිපත්තිය සැලකිය යුතු උල්ලංඝනය කිරීම් පිළිබඳ විශ්ලේෂණය කිරීම
  - කාර්යමණ්ඩලයෙන්, ස්වේච්ඡා සේවකයන්ගෙන්, දරුවන්ගෙන්, පවුල්වලින් හා ප්‍රජාවන්ගෙන් පසුපෙවුම් ලබා ගැනීම සිදු වේ.
  - සංවිධානය විසින් සෑම ළමා ආරක්ෂක ප්‍රමිතියක්ම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර තිබේ ද යන්න. (10.1, 10.2 සහ 3 සහ 4.3ට සම්බන්ධය)
- සංවිධානයේ ළමා ආරක්ෂණ භාවිතයන් පිළිබඳ සමාලෝචනවලට ප්‍රතිචාර වශයෙන් කළ සොයාගැනීම් සහ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා, කාර්යමණ්ඩලය, ස්වේච්ඡා සේවකයන්, දරුවන්, පවුල් සහ ප්‍රජාවන් සමග බෙදා ගැනීම සිදු වේ. (10.3)

# 11 වැනි ප්‍රමිතිය: දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් සංවිධානය ආරක්ෂිත වන්නේ කෙසේද යන්න පිළිබඳව ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ලේඛනගත කරයි

**11 වැනි ළමා ආරක්ෂක ප්‍රමිතියට අනුකූල වෙමින්, සංවිධානයක් විසින් අවම වශයෙන් පහත දැක්වෙන දේ සහතික කළ යුතුය: .**

11.1 ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් සෑම ළමා ආරක්ෂක ප්‍රමිතියක් ම ආමන්ත්‍රණය කරයි.

11.2 ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ලේඛනගත කර ඇති අතර අවබෝධ කර ගැනීම පහසුය.

11.3 මනා භාවිත ආකෘති හා පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම මගින් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාට සැකසීම පිළිබඳව දැනුම්වත්බව ලබා දෙයි.

11.4 නායකයින් විසින් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි වලට අනුකූල වීම වෙනුවෙන් ඉදිරිපත් වීම හා නිරූපනය කරයි.

11.5 කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවබෝධයක් පවතියි.

## ප්‍රධාන කරුණු

- සියලුම ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ලේඛනගත කිරීම මගින් ළමා ආරක්ෂාව වැදගත් බවට සංවිධානයට සම්බන්ධ සියලු දෙනාට පණිවිඩයක් ලබා දෙයි. කැමති පිළිවෙත් සිතේ තබා ගැනීම හෝ සංවිධානයේ සිටින සෑම කෙනෙකු ම දැනටමත් නිවැරදි දේ කරමින් සිටින බව විශ්වාස කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. රීති සහ අපේක්ෂාවන් ප්‍රතිපත්තිය තුළ ලියා විධිමත් කළ යුතු අතර එමගින් ඒවා බෙදා ගැනීමට සහ ඔබේ සංවිධානය පුරා අඛණ්ඩව ළමා ආරක්ෂාව කාවැද්දීමට භාවිත කළ හැකිය.
- සංවිධානය විසින් යහපැවැත්ම ප්‍රවර්ධනය කරන ආකාරය සහ ළමා ආරක්ෂාව පිළිබඳ ගැටලු වළක්වන හා ඒවාට ප්‍රතිචාර දක්වන ආකාරය විස්තර කිරීම මගින් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඔබේ සංවිධානය තුළ සිටින පුද්ගලයින්ට මග පෙන්වනු ඇත. ‘ප්‍රතිපත්ති’ යනු සංවිධානයේ ලේඛනගත නීති, අපේක්ෂා සහ තනතුරු වේ. 'ක්‍රියාපටිපාටි' යනු සංවිධානයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ලේඛනගත ක්‍රියා සහ ක්‍රියාවලි වේ.
- සමහර ළමා ආරක්ෂක ගැටලුවලට ප්‍රතිචාර දැක්වීම සංකීර්ණ විය හැකි වුවත් ඔබේ සංවිධානයේ ප්‍රතිපත්ති හැකි තරම් සරලව ලිවීමට ඉලක්ක කළ යුතුය. අදාළ ප්‍රේක්ෂකයන් සිතේ තබාගෙන, තේරුම් ගත යුතු සෑම කෙනෙකුටම

ප්‍රවේශ විය හැකි භාෂාවක් භාවිතා කිරීමට වග බලා ගනිමින් ප්‍රතිපත්ති ලියා දැක්විය යුතු වේ.

- හුදකලාව ප්‍රතිපත්ති සකස් කරන්නේ නම් ඵලදායී ප්‍රතිපත්ති නිෂ්පාදනය කිරීම අපහසු වන අතර - ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පුද්ගලයින්ගෙන් සහ ඒවායේ බලපෑමට ලක් වූවන්ගෙන් එම ප්‍රත්පත්ති සැකසීම සම්බන්ධයෙන් අදහස් විමසිය යුතුය. ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සැකසීමේ දී, සංවිධාන විසින් දරුවන්ට, පවුල්වලට සහ ප්‍රජාවන්ට අදහස් ප්‍රකාශ කිරිමට අවස්ථා ලබා දිය යුතුය.
- බොහෝ ළමා ආරක්ෂණ කරුණු සුවිශේෂී නොවන අතර ඒවා ගැන අනෙකුත් සංවිධාන, ප්‍රධාන ආයතන, විශේෂඥයින් සහ විද්වතුන් විසින් මීට පෙර සලකා බලා ඇත. අන් අයගේ 'අත්දැකීම්' මගින් ලබා දෙන ප්‍රතිවේදයන් භාවිත කිරීම, සහ පවතින පර්යේෂණ සහ ලිඛිත මගපෙන්වීම මගින්, ඔබේ සංවිධානයට දරුවන් වෙනුවෙන් හොඳම ප්‍රතිඵල ලබා දීමට උපකාර කළ හැකිය.
- අනුකූලතාවය වෙනුවෙන් ඉදිරිපත් වීම හා නිරූපනය කිරීම යන්නෙන් අදහස් වන්නේ නායකයින් ළමා ආරක්ෂාව සහ යහපැවැත්මේ ඇති වැදගත්කම පිළිබඳව ක්‍රියාශීලී, විවෘත ප්‍රවේශයක් ගන්නා බවයි. ළමා ආරක්ෂණ කරුණු බැරෑරුම් ලෙස සැලකීම, කඩිනමින් සහ පරිපූර්ණව ප්‍රතිචාර දැක්වීම, සහ සංවිධානය පුරා ළමා ආරක්ෂණ භාවිතයන් කාවැද්දීමට අවශ්‍ය කාලය සහ සම්පත් කාර්ය මණ්ඩලයට සහ ස්වේච්ඡා සේවකයන්ට ලබා දීම මගින් නායකයෝ 'සිය වචන ක්‍රියාවට නංවති'.
- ඔබේ සංවිධානයේ කාර්යමණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් ළමා සුරක්ෂිත සංවිධානයක් නිර්මාණය කිරීමේ හි ලා තීරණාත්මක කොටසක් වන අතර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය තොරතුරු සහ සහාය ඔවුන්ට ලබා දිය යුතුය.

## අනුකූලතා දර්ශක

### මෙම ප්‍රමිතිය ඇගයීමට ලක් කිරීමේ දී කොමිසම විසින් සොයා බලන්නේ මොනවාද?

සංවිධානයට මෙම ප්‍රමිති සපුරා ගැනීමට උපකාරී වන ආකාරයෙන් එම මෙම ලියවිලි සකස් කිරීම හා කටයුතු ක්‍රියාත්මක සිදු කරන්නේ නම්, සමාන්‍යයෙන් සංවිධාන අනුකූල වනු ඇත.[26]

---

[26] ඔබේ සංවිධානයේ ස්වභාවය හෝ ලක්ෂණ අනුව මෙම මාර්ගෝපදේශයෙහි යෝජනා කර ඇති දේට වඩා වෙනස් දෙයක් කළ යුතු බව අදහස් වීම ද සිදු විය හැකිය. එසේ වුවහොත්, ඔබේ ප්‍රවේශය ප්‍රමිතිවල ප්‍රතිඵල සහ අවම අවශ්‍යතාවලට අනුකූල වන ආකාරය පැහැදිලි කිරීමට ඔබට සිදු විය හැකිය. සමහර ක්ෂේත්‍ර හා සංවිධානවල විශේෂිත මාර්ගෝපදේශ නිකුත් කරන ලද සම නියාමකයෝ සිටිති. ප්‍රමිති පිළිබඳව සම-නියාමකයෙකුගේ මග පෙන්වීම ඔබේ සංවිධානයට අදාළ වන විට, හා එය මෙම මාර්ගෝපදේශයෙන් වෙනස් වන විට, ඔබේ සංවිධානය විසින් එම ක්ෂේත්‍රයේ සිදු කරන කටයුතුවල දී සම නියාමකයාගේ මග පෙන්වීම අනුගමනය කළ යුතුය.

## ලේඛන

- ළමා ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳ ප්‍රතිපත්තියක් මගින් එක් එක් ළමා ආරක්ෂක ප්‍රමිති සම්බන්ධයෙන් සංවිධානයේ අපේක්ෂාවන්, භාවිතයන් හා ප්‍රවේශය සඳහන් කරයි. (11.1, 11.2 හා 2.3ට සම්බන්ධය)
- ආචාර ධර්ම සංග්‍රහය කාර්ය මණ්ඩලයේ සහ ස්වේච්ඡා වෘත්තිකයන්ගේ හැසිරීම් සහ වගකීම් පිළිබඳ අපේක්ෂාවන් විදහාදක්වයි. (11.1, 11.2 සහ 2.4ට සම්බන්ධයි)
- අවදානම ඇගයීම කිරීම සහ කළමනාකරණ සැලසුම් මගින් ළමා අපචාර හා හානි පිළිබඳ අවදානම ආමන්ත්‍රණය කරයි. (11.1, 11.2 and links to 9.1 and 9.3)
- පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාවලීන් මගින් සංවිධානය ප්‍රතිචාර දක්වන ආකාරය සහ සියලු අභ්‍යන්තර සහ බාහිර වාර්තා කිරීමේ වගකීම් ආමන්ත්‍රණය කරයි. (11.1, 11.2 සහ 7 ප්‍රමිතියට සම්බන්ධයි)
- ආයතනික බඳවා ගැනීම්, මානව සම්පත් සහ ස්වේච්ඡා සේවය සැපයීමේ ප්‍රතිපත්තිවලට පැහැදිලි ළමා ආරක්ෂාව පිළිබඳ අවධාරණයක් තිබේ. (11.1, 11.2 සහ 6 වැනි ප්‍රමිතියට සම්බන්ධයි)
- ඔබේ සංවිධානය තෙවැනි පාර්ශවයන්වල පහසුකම් සහ/හෝ සේවා කොන්ත්‍රාත්තු ලබා දෙන්නේ නම්, ප්‍රසම්පාදන ප්‍රතිපත්ති මගින් දරුවන්ගේ ආරක්ෂාව සහතික කරයි. (11.1, 11.2 සහ 9.4ට සම්බන්ධයි)

## ක්‍රියාමාර්ග

- ඔබේ සංවිධානයට සම්බන්ධ සියලු දෙනා සමග ළමා ආරක්ෂාව පිළිබඳ නිතිපතා අදහස් විමසීම් සිදු කරනු ලැබේ. (11.3 සහ ප්‍රමිති 3 සහ 4 ට සම්බන්ධයි)
- සංවිධානය විසින් ළමා ආරක්ෂාවට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීමට, සමාලෝචනය කිරීමට සහ යාවත්කාලීන කිරීමට උපකාර කිරීම සඳහා ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම නිර්මාණය කිරීම පිළිබඳ අදහස් විමසීම් සහ පවතින තොරතුරුවල ආදානය භාවිතා කරයි. (11.3)
- සංවිධානයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මගින් සෑම ළමා ආරක්ෂණ ප්‍රමිතියක් ම ආවරණය කරන අතර සංවිධානයට සහ එහි පරිසරයට විශේෂිත වූ දරුවන්ගේ ආරක්ෂාවට ඇති අවදානම් ආමන්ත්‍රණය කරනු ලබයි. (11.1)
- ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි තේරුම් ගැනීමට පහසු වන අතර ඒවා පහසුවෙන් ප්‍රවේශ විය හැකි සේ පවතියි.

කොමිසම විසින් වික්ටෝරියාව පුරා භූමියේ සාම්ප්‍රදායික භාරකරුවන් ගෞරවණීයව පිළිගනිමින් ඔවුන්ව සමරන අතර ඔවුන්ගේ අතීත, වර්තමාන මෙන් ම අනාගත පරම්පරාවල වැඩිහිටියන් මෙන් ම දරුවන් සහ යොවුන් පුද්ගලයන්ට සිය ගෞරවය පුදකර සිටියි.

© දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසම 2023

මෙම කාර්යයට ප්‍රකාශන හිමිකම් සහිතයි. *1968 බුද්ධිමය දේපල පනත* යටතේ අවසර ලබා දී ඇති ආකාරයෙන් භාවිත කිරීම හැර, දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසමේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව කිසිම ක්‍රියාපටිපාටියක් මගින් කිසිම කොටසක් නැවත පිටපත් කළ නොහැක.

**දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් වන කොමිසම**

Level 18, 570 Bourke Street
Melbourne, Victoria, 3000

DX210229

දුරකථන: 1300 78 29 78
ඊමේල්: contact@ccyp.vic.gov.au
වෙබ් අඩවිය: ccyp.vic.gov.au

අපව:
ඉන්ස්ටග්‍රෑම්
ෆේස්බුක්
ට්විටර් ඔස්සේ සෙයාගත හැකිය.